# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 11,709 — 1959 මාර්තු 26 වැනි බ්‍රහස්පතින්ද—26.3.1959

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (II) වැනි ඡේදය—පළකිරීම්

(එක් එක් කොටස වෙන වෙනම බැඳ තබා ගත හැකි වීම පිණිස පිටු අංක යොදා ඇත්තේ වෙන වෙනම එක් එක් කොටසට ගැලපෙන පරිද්දෙනි)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... | 805 | තොටුපළ රේන්ද හා වෙනත් රේන්ද විකිණීම | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... | 809 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... | 810 | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් | — | වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම් ... | — |
| බඩු බාහිරාදිය විකිණීම ... ... | 816 | විවිධ දැන්වීම් ... ... | — |


## තනතුරු—ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසි

**දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ ජීවන දීමනාව යන මෙම දීමනා, ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන්හිදී, ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

**2. සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කායයි සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධානවලට හෝ රෙගුලාසිවලට හෝ යටත් වන්නේ ය.

**3. සේවයට බාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර) ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් සවකීය මනාපය පරිදි තවත් සියයට 5ක් ද ඊට එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7½කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබීම කළ යුතුය"යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානයන් විසින් තීරණය කරනු ලැබුවහොත්, එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගේ (ඇප) ආඥාපනතට අනුකූල ව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවාවෙහි සිටින්නන්ට හැර සෙස්සන්ට, ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද, නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

**4. නවප්‍රවේශක නිලධාරීහු.**—(i) විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරු වලට පත් කරනු ලබන "නවප්‍රවේශක නිලධාරීන්" සම්බන්ධයෙන්, කිසියම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇති අවස්ථාවන්හිදී මිස, අන් හැම අවස්ථාවකදීම ආධුනික/පරීක්ෂා කාලය යථායෝග්‍ය පරිදි තුන් වර්ෂයක් වේ.

(ii) "නවප්‍රවේශක නිලධාරීන්" ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීමත් විශේෂයෙන්ම 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමත් සඳහා දැනට පනවා ඇති ව්‍යවස්ථාවලට මෙන් ම මින් මතු පනවනු ලබන ව්‍යවස්ථාවලට ද අනුකූල ව ක්‍රියා කළ යුතු වේ.

(iii) (අ) මෙම නිලධාරීන් සවකීය ආධුනික/පරීක්ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයෙහි ප්‍රවීණතාවක් ලබා ගත යුතුය.

(ආ) සිංහල භාෂාව පිළිබඳ ප්‍රවීණතා පරීක්ෂණයකින් සමත්වීම, ආධුනික/පරීක්ෂා කාලය අවසන් වීමෙන් පසු එම නිලධාරීන්ගේ තනතුරු ස්ථිර කිරීම සඳහා අවශ්‍ය වන සුදුසුකම් අතුරින් එකක් වේ.

ආධුනික/පරීක්ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයෙහි ප්‍රවීණතාව සම්බන්ධයෙන් නියමිත වූ තත්ත්වයට එළඹීමට අසමත් වන අය තනතුරෙන් පහකරනු ලැබීමට ඉඩ තිබේ. එහෙත් "ඔවුන් රාජ්‍ය භාෂාව හැදෑරීමෙහි ලා අව්‍යාජ ප්‍රයත්නයක් දරා ඇතැ" යි ඔවුන් එම තනතුරුවලට පත් කළ බලධාරීන් විසින් පිළිගැනෙතොත්, එසේ තනතුරුවලින් පහ කිරීම ප්‍රමාද කිරීමට ඉඩ තිබේ. එබඳු වූ කිසියම් නිලධාරියකු නියමිත දිනයට පසු සැහෙන කාල සීමාවක් ඇතුළත සිංහල භාෂා ප්‍රවීණතාව සම්බන්ධයෙන් පැවැත්වෙන පරීක්ෂණයකින් සමත් වුවහොත්, කලින් අසමත් වීම නිසා ඔහුට නැති වී ගිය ජ්‍යෙෂ්ඨත්වය නැවත ලබා දීම, එම කාර්යය පිළිබඳ නිසි බලධාරීහුගේ කැමැත්ත පරිදි සිදු වේ.

(iv) සිංහල මාධ්‍යයෙන් සුදුසු කම් ලබා රාජ්‍ය සේවාවට ඇතුළු වන නවප්‍රවේශක නිලධාරීහු සිංහල භාෂා ප්‍රවීණතා පරීක්ෂණයෙන් නිදහස් කරනු ලැබෙත්.

**සංලක්ෂ්‍යය.**—"නවප්‍රවේශක නිලධාරීහු" යනුවෙන් මෙහි දී අදහස් කෙරෙනුයේ 1956 සැප්තැම්බර 24 වැනිදා හෝ ඊට පසු ව හෝ රාජ්‍ය සේවාවේ තනතුරුවලට පත් කරනු ලැබුවා වූද, එසේම 1957 මැයි 23 වැනි දින නිකුත් කළ අංක 379 දරන භාණ්ඩාගාර චක්‍ර ලේඛයේ 2 (ii) (ආ) සහ 2 (ii) (ඇ) දරන අනුච්ඡේදයන්ට අනුකූල ව ආදිප්‍රවේශක නිලධාරීන් වශයෙන් නොසැලකෙන්නා වූද තැනැත්තෝ වෙත්.

**5. අවශ්‍ය සුදුසුකම්.**—තමා ලාංකිකයකු වූ බවට සැහෙන සාක්ෂ්‍ය සෑම ඉල්ලුම්කරුවකු විසින්ම ඉදිරිපත් කළ යුතු ය. "ලාංකික" යනුවෙන් අදහස් කෙරෙනුයේ පරම්පරාවෙන් හෝ ලියා පදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියකු වූවෙකි.

**6. යුද්ධසේවා අනුග්‍රහය.**—මෙම තනතුරු සඳහා අන්‍ය සෑම අයුරෙක ම සුදුසුකම් ලැබ සිටින්නා වූද, මහා රාජිනියන් වහන්සේගේ යුද හමුදාවන්හි යෙදී සිට සේවා මුක්ත වූද අයට හා සහාය ගිනි නිවන සේවාව, ගගන ප්‍රහාර නිවාරණ සේවාව, මහජනාරක්ෂක සේවාව යන මෙම සේවාවන්හි සම්පූර්ණ කාල සේවයෙහි යෙදී සිටි (සිය කැමැත්තෙන් ම සේවයෙන් අස් වූවන් හැර) සෑම කෙනකුට මද, ඔවුහු 1945 අගෝස්තු මස 15 වැනි දිනට පෙර එම හමුදාවන්ට බැඳී සතුටුදායක ලෙස නොකඩව සේවය කළෝ නම්, වයස පිළිබඳ සුදුසුකම් ලබා ගැනීම සඳහා පමණක්, ඉතා ඈතින් 1939 සැප්තැම්බර 3 වැනි දිනත් ඉතා මෑතින් 1949 දෙසැම්බර 31 වැනි දිනත් යන මෙදෑතුර තමන් එසේ සේවයෙහි යෙදී සිටි කාලපරිච්ඡේදය තම වයසින් අඩු කර ගැනීමට ඉඩ දෙනු ලැබේ.

**7. වෙනත් අවශ්‍ය කරුණු.**—(i) දැනට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින අවශ්‍ය සුදුසුකම් ඇති නිලධාරීන් මෙම තනතුරුවලට ඉල්ලුම් පත් එවිය යුත්තේ සවකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් මාර්ගයෙනි. රාජ්‍ය සේවාවේ සථිර තනතුරු දරන නිලධාරීන් විසින් එවන ලද ඉල්ලුම් පත් ඉදිරිපත් කිරීමේදී, ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීහු, එම ඉල්ලුම් කරුවන් (තෝරාගනු ලැබුවහොත්) කාර්ය සංවිධාන සංග්‍රහයේ 109 වැනි පාලන රෙගුලාසියට අනුකූල ව ඔවුන්ගේ නිලවලින් මුදා හැරීමට තමන් සූදානම් ව සිටිත් ද, නැද්ද" යි සඳහන් කොට එවිය යුතු ය.

(ii) සම්මුඛ පරීක්ෂණයක් සඳහා නියමිත වේලාවක, දන්වනු ලබන තැනකට පැමිණෙන ලෙස අපෙක්ෂකයන්ට නියම කරනු ලැබිය හැකි ය. මේ සම්බන්ධයෙන් කිසි ම ගමන් වියදමක් හෝ අන් කිසි වියදමක් හෝ ගෙවනු නො ලැබේ.

(iii) කිසියම් අපෙක්ෂකයකු ගැන නිර්දේශයක් කිරීමට යමකුට වුවමනා නම් ඔහු එසේ කළ යුත්තේ එම අපේක්ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්ෂකයකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමකින් වුවත් අයථා අනුග්‍රහයක් ලබා ගැනීමකට හෝ බල පැවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුව හොත්, ඒ හේතුවෙන් ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත්වන්නේ ය.

(iv) යම් අයැදුම්කරුවකුගේ ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි අසත්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බැව් ඔහු තෝරාගැනීමට කලින් දැනගන්ට ලැබුණි නම් ඒ හේතුවෙන් ම ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

(v) මේ දැන්වීමේ සඳහන් නියමයන්ට කවර ලෙසකින් වුවත් නො ගැළපෙන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**තාවකාලික භාෂා පරිවර්තක තනතුරු—II වන ශ්‍රේණිය (සිංහල)**

අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ II ශ්‍රේණියේ තාවකාලික භාෂා පරිවර්තක තනතුරු (සිංහල) සඳහා අයදුම් පත් එවන ලෙස **පහත දැක්වෙන 4 වන ඡේදය අනුව සුදුසුකම් තිබෙන අයදුම් කරුවන්ට** මෙයින් ආරාධනය කරමි. මෙහි පහත සඳහන් වෙන ෆෝර්මය අනුව පිළියෙල කළ අයදුම් පත් 1959 අප්‍රේල් මස 16 වන දිනට ප්‍රථමයෙන් අධ්‍යාපනාධ්‍යක්ෂවරයාට ලැබෙන සේ "අධ්‍යාපනාධ්‍යක්ෂ, පාලන ශාඛාව, මලයි වීදිය, කොළඹ 2" යන ලිපිනයට එවිය යුතු ය.

2. **වැටුප.**—මේ තනතුරට හිමි වාර්ෂික වැටුප් ක්‍රමය රුපියල් 1,620න් පටන් ගෙන රු. 120 වාර්ෂික වැඩිවීම් ඇතිව රු. 3,780ට තෙක් නගී. වාර්ෂික වැටුප රු. 2,820ට ප්‍රථමයෙන් කාර්යක්ෂමතා කඩ ඉමක් වේ.

3. **සේවාව පිළිබඳ කොන්දේසි.**—

(i) මේ තනතුර තාවකාලිකය. විශ්‍රාම වැටුප් රහිතය ;

(ii) සථිර තනතුරක් දරන නිලධාරියකු තෝරාගනු ලැබුවහොත්, ඔහු කලින් දැරූ ධුරය වෙනුවට මේ ධුරයට තාවකාලිකව අවුරුදු දෙකකට මුලදී පත් කරනු ලැබේ.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකුම—

(අ) දැනට රජයේ සථිර තනතුරක් දරන්නේ නැත්නම්, 1959 අප්‍රියෙල් මස 16 වැනි දිනට තමාගේ වයස අවුරුදු 19 ට නො අඩු බවටත් අවුරුදු 25ට නො වැඩි බවටත් (රජයේ සේවයේ සථිර තනතුරක යෙදී ඇත්නම් අවුරුදු 45ට නොවැඩි බවටත්) ;

(ආ) යටත් පිරිසෙයින්—

(i) ලන්ඩන් විශ්ව විද්‍යාලයේ පොදු අධ්‍යාපන සහතික (උසස්) විභාගයේදී සිංහලෙන් හෝ

(ii) සිංහල (විශෙෂ සිංහල නොවේ) විෂයයක් වශයෙන් ඇතිව උසස් පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ

(iii) සිංහල විෂයයක් වශයෙන් ඇතිව ඉන්ටර්/කලා අංශයේ ප්‍රථම හෝ සාමාන්‍ය සුදුසුකම් විභාගයකින් හෝ

(iv) සිංහල ප්‍රවීනතා (උසස්) විභාගයෙන් හෝ

සාමාර්ථ්‍යයක් ඇතුළුව

(i) සිංහල හෝ ඉංග්‍රීසි ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් සමත්වී, ඒ විභාගයෙන් සමත් වූ අවස්ථාවේ දීම හෝ ඉන් පසුව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ දී හෝ පොදු අධ්‍යාපන සහතික පත්‍ර (සාමාන්‍ය) විභාගයේ දී හෝ ඉංග්‍රීසි භාෂාවෙන් හෝ ඉංග්‍රීසි සාහිත්‍යයෙන් සම්මාන සාමාර්ථ්‍යයක් ; හෝ

(ii) පොදු අධ්‍යාපන සහතික පත්‍ර (සාමාන්‍ය) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාවෙන් හෝ ඉංග්‍රීසි සාහිත්‍යයෙන් සම්මාන සාමාර්ථයක් ඇතිව කවර මාධ්‍යයකින් හෝ එම විභාගයේ දී තවත් විෂයයන් පහකින් සාමාර්ථ්‍යයක් හෝ

ලබා ඇති බවටත්

(**සැලකිය යුතුයි.**—පොදු අධ්‍යාපන සහතික පත්‍ර විභාගයේ දී සමත්විය යුතු විෂයයන් හයෙන් පහක් ම එකම විභාගයක දී සමත්විය යුතු ය.)

(ඇ) හොඳ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව වත් සැහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතු ය.

5. සෑම අයදුම් කරුවකුම විසින් පහත පෙනෙන සහතිකවල පිට පත් තම අයදුම් පතට අමුණා එවිය යුතුය. (මුල් පිටපත් ඇමිණිය යුතු නොවේ):—

(අ) උප්පැන්න සහතිකය (බවුතීස්ම සහතික පත්‍රය හෝ උපකෘත පාඨශාලා පිළිබඳ ව්‍යවස්ථා පොතේ සඳහන් කටයුතු සඳහා දෙන සහතික පත්‍ර හෝ භාරගනු නොලැබේ) ;

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික ;

(ඇ) අයදුම්කරුවන් ගේ චරිතය, මේ තනතුරට ඇති යොග්‍යතාව යන මේවා සම්බන්ධයෙන් මෑතදී ලබාගන්නා ලද සහතික තුනක් (දැනට රජයේ සේවයේ යෙදී සිටින අයදුම් කරුවන් විසින් සහතික එවීම අවශ්‍ය නැත).

**සැලකිය යුතුයි.**—සහතික පත්‍රවල හා චරිත සහතික පත්‍රවල පිටපත් ආපසු එවනු නොලැබේ.

6. 4 වන ඡේදය අනුව සුදුසුකම් ඇති, රජයේ සේවයේ නියුක්ත නිලධාරීන් විසින් අයදුම්පත් එවිය යුත්තේ ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානයන් මගිනි. සථිර තනතුරක් දරන නිලධාරියකුගේ අයදුම් පතක් ඉදිරිපත් කරන විට (ඔහු තෝරා ගනු ලැබුවහොත්) කාර්ය සංවිධාන සංග්‍රහයේ 109 වන පාලන රෙගුලාසිය යටතේ ඔහු සේවයෙන් නිදහස් කළ හැකිද නැද්ද යන වග දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා විසින් සඳහන් කළ යුතුය. එම අයදුම් පත් නියමිත දිනට පසු මේ කාර්යාලයට ලැබුනහොත්, එම දෙපාර්තමේන්තුවේ ප්‍රධානයන් වෙත ඒවා නියමිත දිනට පෙර ඉදිරිපත් කරන ලදින් ඔවුන් විසින් ප්‍රමාදයට හේතු දන්වා පිළිගැනීම මැනැවැයි නිර්දේශ කර නැති නම් ඒ අයදුම් පත් පිළිගනු නොලැබේ.

7. අයදුම් පත් හෝ ඒ පිළිබඳ සෙසු ලියුම් කියුම්, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ යම්කිසි නිලධාරියෙකුගේ පෞද්ගලික නමට නොව අධ්‍යාපන අධ්‍යක්ෂවරයාගේ ලිපිනයට එවිය යුතු ය.

8. **මුද්‍රිත අයදුම් පත් ෆෝරම නැත. මෙහි පහත දී තිබෙන ආදර්ශයෙන් ෆෝරමය පිටපත් කර ගත යුතු ය.**

9. මේ ගැසට් පත්‍රයේ I වන කොටසේ (II) වන ඡේදයෙහි පළ කර තිබෙන රජයේ සේවයේ තනතුරුවලට පත් කිරීම් සම්බන්ධයෙන් යෙදෙන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

10. එවන සෑම අයදුම් පතක් ම මෙහි ලැබුණු බව දන්වා එවනු ලැබේ. අයදුම් පත් භාරගත් අවසාන දිනය සිට දින තුනක් ඇතුළත එවැනි දන්වීමක් යම් අයදුම්කරුවකුට නොලැබුණොත් ඔහු විසින් ඒ බව වහාම අධ්‍යාපනාධ්‍යක්ෂ තැන වෙත කොළඹ 2, මලයි වීදියේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පාලන ශාඛාවට දන්වා එවිය යුතු ය.

බී. එච්. ද සොයිසා,
අධ්‍යාපනාධ්‍යක්ෂ වෙනුවට.

ඒ. බී. කේ. 1317,
1959 මාර්තු මස 21 වැනි දින,
කොළඹ 2, මලයි වීදියේ,
අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ දී ය.

### ආදර්ශ පෝර්මය

**II වන ශ්‍රේණියේ තාවකාලික භාෂා පරිවර්තක (සිංහල) තනතුරු පිළිබඳ ඉල්ලුම් පත්‍රය**

1. සම්පූර්ණ නම—
   (අ) අගට යෙදෙන නම :————.
   (ආ) අනිත් නම් :————.
   (අච්චු අකුරෙන්)

2. ලිපිනය :————.

3. (අ) 1959 අප්‍රියෙල් මස 16 වන දිනට සම්පූර්ණ වන වයස— අවුරුදු —— මාස —— දවස් ——.
   (ආ) උපන් දිනය :————.
   (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය)

4. ජාතිය හා එය කෙසේ හිමිවිද යන වග :————.

5. උපන් ස්ථානය—
   (අ) අයදුම් කරු :————.
   (ආ) පියා :————.
   (ඇ) පිය පාර්ශවයේ මුත්තා (පියාගේ පියා) :————.
   (ඈ) පිය පාර්ශවයේ මීමුත්තා :————.

6. අයදුම්කරු විවාහකද අවිවාහකද කණවැන්දුම්ද යන බව (විවාහක නම් විවාහ වූ දියනත්, දරුවන් ගණනත් සඳහන් කළ යුතුය) :————.

7. අධ්‍යාපනය ලත් පාඨශාලා හා විද්‍යාල (ඒවාට ඇතුලත් වූ හා අස්වූ දින සඳහන් කළ යුතුයි ):————.
   (අ) සාමාන්‍ය අධ්‍යාපනය :————.
   (ආ) වෘත්තිය අධ්‍යාපනය :————.

8. අධ්‍යාපන සුදුසුකම් (නිවේදනයේ 4 (ආ) ඡෙදය අනුව ඇති සුදුසුකම් පැහැදිලිව සඳහන් කළ යුතුයි. සහතික පත්‍රවල පිටපත් ද අමුණා එවිය යුතුය.) :————.

9. පරිවර්තක වැඩ සම්බන්ධයෙන් පළ පුරුදු කම් තිබේ නම් විස්තර සඳහන් කරන්න :————.

10. (අ) පාඨශාලාවෙන් හෝ විද්‍යාලයෙන් අස්වූ පසු නියුක්ත වූ රක්ෂාවල් ද ඒවාට බැඳුණු දිනයද ඒවායින් අස් වූ දිනයද සඳහන් කරන්න.
    (ආ) දැනට කරන රක්ෂාව (තනතුර හා රක්ෂාව කරන ස්ථානය ලියන්න ):————.

11. විශෙෂ හිමිකම් හා සුදුසුකම් පිළිබඳ විස්තර :————.

12. චරිත සහතික දී ඇති අයගේ නම් සහ තත්ත්ව (ඥාතීන් නොවිය යුතුයි—මෑතකදී ලත් චරිත සහතිකවල පිටපත් තුනක් පමණක් අමුණා එවිය යුතුයි ):————.

13. යුද්ධ සේවයේ යෙදී සිටියෙහි නම් ඒ පිළිබඳ විස්තර (අස්වීයෑමේ සහතිකයේ පිටපතක් අමුණා එවිය යුතුයි ):————.

14. වෙනත් විස්තර :————.

ම විසින් මේ අයදුම් පතෙහි සඳහන් කර ඇති විස්තර නිවැරදි බවත් සත්‍ය බවත් මම මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කර ඇති යම්කිසි කරුණක් වැරදි හෝ අසත්‍ය බව හෝ පත්වීම දීමට ප්‍රථමයෙන් එළිදරව් වුවහොත් මගේ අපෙක්ෂකත්වය අවලංගු කිරීමට ද, පත්වීම ලැබුවාට පසුව එළිදරව් වුවහොත් කිසිම වන්දි ගෙවීමක් නැතිව මා නිලයෙන් පහ කිරීමටද යටත් වන බව මා දන්නා බවත් මෙයින් ප්‍රකාශ කරමි.

අත්සන :————.

දිනය :————.

### ගුවන් විදුලි දෙපාර්තමේන්තුව

**වෙළඳ සේවයේ (ඉංග්‍රීසි) වැඩ සටහන් විස්තර සහ නිබන්ධ සම්පාදක**

ගුවන් විදුලි දෙපාර්තමේන්තුවේ, වෙළඳ සේවයේ (ඉංග්‍රීසි) වැඩසටහන් විස්තර සහ නිබන්ධ සම්පාදක තනතුරකට දැන් ඉල්ලුම් පත් පිළිගනු ලැබේ.

මෙම දැන්වීම පා මුල දක්වෙන ආදර්ශ ආකෘතියේ ආකාරයට සැපයිය යුතු ඉල්ලුම්පත්, 1959 අප්‍රේල් මස 11 වැනි දින නො ඉක්මවා ලැබෙන සේ කොළඹ, ලංකා ගුවන් විදුලි ආයතනයේ, ගුවන් විදුලි සේවා අධ්‍යක්ෂ ජනරාල් නමට එවිය යුතුයි. ආකෘති පත්‍ර වෙනම සපයනු නො ලැබේ. ලිපිකවරයේ ඉහළ වම් කෙළවර "වැඩසටහන් විස්තර හා නිබන්ධ සම්පාදක (ඉංග්‍රීසි)" යන්න පැහැදිලි අකුරෙන් ලිවිය යුතුයි.

2. **වැටුප් ක්‍රමය.**—මෙම තනතුරට නියමිත වාර්ෂික වැටුප් ක්‍රමය රු. 2,700—10×120—6×180—4,980 කි. කාර්යක්ෂමතා කඩඉම් ද මේ ක්‍රමයේ ඇතුලකි.

3. **සේවයට බඳවා ගැනීමේ කොන්දේසි.**—මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය. ආරම්භයෙන් පත්වීම දෙනු ලබන්නේ තුන් වසක සෝදිසි කාලයකට ය.

4. **අවශ්‍ය සුදුසුකම්.**—(1) සෑම අයදුම් කරුවකු විසින් ම යට දක්වෙන කරුණු ස්ථුට කෙරෙන සෑහෙන සාක්ෂ්‍ය ඉදිරිපත් කළ යුතුයි :—

(අ) 1959 අප්‍රේල් 11 වැනි දිනට වයසින් අවුරුදු 21 ට නො අඩු හා 40 ට නො වැඩි බව; (මෙම දෙපාර්තමේන්තුවේ සේවය කරන අයදුම් කරුවන්ට වයස් සීමාව බලපවත්වන්නේ නැත.)

(ආ) පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධරයෙකු හෝ ලංකා විශ්ව විද්‍යාලයේ ප්‍රථම පරීක්ෂණයෙන් සමත් වූවකු හෝ අනෙක් පිළිගත් විශ්ව විද්‍යාලයයක මධ්‍ය පරීක්ෂණයෙන් නැතහොත් සමාන විභාගයකින් සමත් වූවකු හෝ බව;

(ඉ) විශිෂ්ට ඉංග්‍රීසි භාෂා ඥානයක් ද, බටහිර සංගීතය හා සාහිත්‍යය ගැන සාමාන්‍ය දැනුමක් ද, පුවත් පත් කලා ආදී කර්තෘත්වයක පළ පුරුද්දක් ද ඇති බව;

(ඊ) විශෙෂයෙන්ම යහපත් චරිතයකින් හා කායික සෞඛ්‍යකින් ද යුක්ත බව.

(2) ලංකාවේ හෝ අන් රටක හෝ ගුවන් විදුලි ප්‍රචාර කටයුතු පිළිබඳව පළපුරුදුකම් ඇති අයගෙන් ද (ඉංග්‍රීසි) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික හෝ ඉන් ඉහළ විභාගයකින් හෝ සාමාර්ථයක් ඇත්නම්, ඉල්ලුම් පත් පිළිගනු ලැබේ.

(3) විශේෂාංග වැඩ සටහන් ඇතුළුව හැම ආකාරයකම ගුවන් විදුලි ප්‍රචාරයකට ම නිබන්ධ සැපයීම ද සමහර විට පතපොතින් හා වේදිකා නාට්‍යවලින් ගුවන් විදුලි වැඩ සටහන් සකස් කිරීම ද, වෙළඳ දැන්වීම් ප්‍රබන්ධකිරීම ද මෙම තනතුර පිරිනැමෙන අයදුම් කරුවාට හිමි කාර්ය වේ.

5. අයදුම්කරුවන් විසින් යට සඳහන් ලියවිලිවල පිටපත් (මුල් ලියවිලි නොව) ඉල්ලුම් පත්‍රයට අමුනා එවිය යුතුයි :—

(1) උප්පැන්න සහතිකය (බෞතිස්ම සහතික හෝ අධ්‍යාපන ව්‍යවස්ථා සංග්‍රහය යටතේ නිකුත් කරන ලද උප්පැන්න සහතික පිළිගනු නො ලැබේ).

(2) ඉහළම අධ්‍යාපනික සුදුසුකම දක්වෙන සහතිකය, සහ

(3) අයදුම්කරුගේ චරිතය, සුදුසුකම්, කාර්ය සූරත්වය සහ තනතුරට පත්කිරීමේ යෝග්‍යත්වය දක්වෙන, මෑතකදී ලබා ගත්, සහතික දෙකක් (දැනට ම රාජ්‍ය සේවයේ යෙදී සිටින අයදුම් කරුවන්ගෙන් මේ උපඡෙදය යටතේ සහතික අනවශ්‍යය).

**සැළකිය යුතුයි.**—මේ සහතික පිටපත් අයදුම්කරුවන් වෙත පෙරළා එවනු නො ලැබේ. මුල් ලියවිලි ඉදිරිපත් කළ යුත්තේ සම්මුඛ පරීක්ෂණයකට කැඳවුවහොත් හා එවිටය.

6. නියමිත දින ඉක්මවා මෙම කාර්යාලයට ලැබෙන රජයේ සේවයේ යෙදී සිටින අයදුම් කරුවන් ගේ ඉල්ලුම් පත්, තම දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට නියමිත කාල සීමාව තුළ දී ලැබී ඇත්නම් හා ඉදිරිපත් කිරීමේ ප්‍රමාදයට වලංගුවන හේතු දක්වමින් ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීන් එය පිළිගත්තා මෙන් නිර්දේශ කළහොත් මිස, පිළිගනු නො ලැබේ.

7. රජයේ සේවයේ තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් මෙම ගැසට් පත්‍රයේ I කොටසේ (II) ඡෙදයේ මුල දක්වෙන පොදු කොන්දේසි බලන්න.

8. ඉල්ලුම් පත් හෝ ඒ සම්බන්ධ ලියවිලි හෝ එවිය යුත්තේ ගුවන් විදුලි සේවා අධ්‍යක්ෂ ජනරාල් නමට මිස මෙම දෙපාර්තමේන්තුවේ අනෙක් නිලධාරියෙකු ගේ නමට පෞද්ගලිකව නොවේ.

9. ඉල්ලුම්පත් ලැබුණු බව දන්වනු නො ලැබේ.

වී. ඊ. ගුණරත්න,
ගුවන් විදුලි සේවා අධ්‍යක්ෂ ජනරාල්.

1959 මාර්තු මස 26 වැනි දින,
කොළඹ 7.

## ආදර්ශ ඉල්ලුම් පත්‍ර ආකෘතිය

### වෙළඳ සේවයේ (ඉංග්‍රීසි) වැඩ සටහන් විස්තර සහ නිබන්ධ සම්පාදක

1. සම්පූර්ණ නම (අච්චු අකුරෙන් ලියන්න)—
   (අ) වාසගම (හෙවත් අගට යෙදෙන නම) :————.
   (ආ) සෙසු නම් :————.

2. ස්ථිර ලිපිනය :————.

3. (අ) 1959 අප්‍රේල් 11 වැනි දිනට නියම වයස—
   අවුරුදු :—— මාස :—— දින :——.
   (ආ) උපන් දින (උප්පැන්න සහතික පිටපත ඇමිණිය යුතුයි.) ————.

4. ජාතිය (1) ලාංකිකත්වය පෙළපතින් ද ලියාපදිංචි කිරීමෙන් ද යන වග :————.
   (2) ලාංකිකත්වය පෙළපතින් නම් යට සඳහන් අය උපන් තැන දන්වන්න—
   (අ) අයදුම්කරු :————.
   (ආ) අයදුම්කරුගේ පියා :————.
   (ඉ) අයදුම්කරුගේ පියා ගේ පියා :————.
   (ඊ) අයදුම්කරු ගේ පියා ගේ පියා ගේ පියා :————.

5. අධ්‍යාපනික සුදුසුකම් (අංක 5 (2) දරණ ඡේදයේ ප්‍රකාර සහතික පිටපත් ඇමිණිය යුතුයි.) :————.

6. ගුවන් විදුලි ප්‍රචාර කටයුතු පිළිබඳ පළපුරුද්ද (එවැනි පළපුරුදුකම් ඇත් නම්) (සාක්ෂ්‍ය ලෙස අමුණන ලියවිලි කවරේ ද?) : ————.

7. චරිත සහතික ලබාගත් අය ගේ නම් සහ ලිපින :————.

8. සේවාමුක්ත හටයින් උදෙසා පැවරෙන අනුග්‍රහය බලාපොරොත්තු වන්නේ ද යන වග (එසේ නම්, යුද සේවාවෙන් අස්වීමේදී ලත් සහතික පත්‍රය හෝ සමාන සාක්ෂ්‍යවල පිටපත් ඇමිණිය යුතුයි.) :————.

9. තේරීමේ දී සැළකුව මනා විශෙෂ ඉල්ලීම්, සුදුසුකම් හා පළපුරුදුකම්වල විස්තර (අංක 4 (2) හා (3) ඡේදයන් බලන්න.) ————.

10. රජයේ සේවයේ කිසි කලෙක යෙදී සිටියේ නම් කවදා කොතැන ද යන්න :————.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

---

## ලංකා ගුවන් විදුලි දෙපාර්තමේන්තුව

### සහකාර මුස්ලිම් වැඩ සටහන් සංවිධායක තනතුර

ගුවන් විදුලි දෙපාර්තමේන්තුවේ ස්වදේශිය සේවයේ සහකාර මුස්ලිම් වැඩ සටහන් සංවිධායක තනතුරක් උදෙසා ඉල්ලුම් පත්‍ර භාරගනු ලැබේ

මෙම දැන්වීම පාමුල දැක්වෙන ආදර්ශ ආකෘතියේ ආකාරයට සැපයිය යුතු ඉල්ලුම් පත්‍ර 1959 අප්‍රේල් 11 වැනි දින නොඉක්මවා ලැබෙන පරිදි කොළඹ ලංකා ගුවන් විදුලි ආයතනයේ ගුවන් විදුලි සේවා අධ්‍යක්ෂ ජනරාල් නමට එවිය යුතුයි. ආකෘති පත්‍ර වෙනම සපයනු නො ලැබේ. ලිපි කවරයේ ඉහළ වම් කෙළවර “ මුස්ලිම් වැඩ සටහන් සංවිධායක ” යන්න පැහැදිලිව ලිවිය යුතුයි.

2. **වැටුප් ක්‍රමය.**—මෙම තනතුරට නියමිත වාර්ෂික වැටුප් ක්‍රමය, රු. 2,820—9 × 120—8 × 180—4 × 240—රු. 6,300 කි.

3. **සේවයට ගැනීමේ කොන්දේසි.**—මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ආරම්භයෙන් පත්වීම දෙනු ලබන්නේ තුන් වසක සෝදිසි කාලයකටය.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම් කරුවෙකුම යට දැක්වෙන කරුණු ඔප්පු කෙරෙන සෑහෙන සාක්ෂ්‍ය ඉදිරිපත් කළ යුතුයි :—

(අ) 1959 අප්‍රේල් 11 වැනි දිනට වයසින් 21 ට නො අඩු හා 45 ට නොවැඩි බව ;

(ආ) පිළිගත් විශ්ව විද්‍යාලයයක උපාධිධරයෙකු හෝ ලංකා විශ්ව විද්‍යාලයයේ කලා/විද්‍යා පිළිබඳ ප්‍රථම පරීක්ෂණයෙන් නැත හොත් සමාන විභාගයකින් සමත්වූවකු බව ;

(ඉ) ඉස්ලාම් ආගම, දර්ශනය හා සංස්කෘතියේ සංවර්ධනයත්, ප්‍රගතියත් පිළිබඳ සුවිශේෂ දැනුමක් ඇති බව ; සිංහල හා දෙමළ භාෂා ඥණය වැඩි සුදුසුකමක් සේ\ සළකනු ලැබේ.

තවද, ඉහතකී අධ්‍යාපනික සුදුසුකම් නැතිවද සෙසු සුදුසුකම් සම්පූර්ණ අයගෙන්, ලංකාවේ හෝ අන් රටක හෝ ගුවන් විදුලි ප්‍රචාර කටයුතු පිළිබඳ සැළකිය යුතු පළපුරුදුකම් ඇති නම්, ඉල්ලුම් පත් පිළිගනු ලැබේ. මෙවැන්නන් තම පළපුරුදුකම් ඔප්පුවෙන සෑහෙන සාක්ෂ්‍ය ඉදිරිපත් කළ යුතුයි.

(ඊ) මනා චරිතයකින් ද කායික සෞඛ්‍යයකින් ද යුක්ත බව.

5. යට දැක්වෙන ලියවිලිවල පිටපත් (මුල් ලියවිලි නොවේ) ඉල්ලුම් පත්වලට අමුණා එවිය යුතුයි :—

(1) උප්පැන්න සහතික පත්‍රය (බෞතීස්ම සහතිකය හෝ අධ්‍යාපන ව්‍යවස්ථා සංග්‍රහය යටතේ නිකුත් කළ උප්පැන්න සහතික හෝ භාරගනු නොලැබේ).

(2) ඉහළම අධ්‍යාපනික සුදුසුකම දැක්වෙන සහතිකය.

(3) අයදුම්කරුගේ සුදුසුකම්, චරිතය, හැකියාව සහ මෙම තනතුරට යෝග්‍ය බව සඳහන් මෑතකදී ලබාගත් සහතික පත් දෙකක් (දැනට ම රජයේ සේවයේ යෙදී සිටින අය දුම්කරුවන්ගෙන් මෙම උප ශීර්ෂය යටතේ නියමිත ලිය විලි අනවශ්‍යය).

**සැළකිය යුතුයි.**—මෙකී සහතික පිටපත් අයදුම් කරුවන් වෙත පෙරළා එවනු නොලැබේ. මුල් ලියවිලි ඉදිරිපත් කළ යුත්තේ අයදුම්කරු සම්මුඛ පරීක්ෂණයකට කැඳවූවොත් හා එවිටය.

6. රජයේ සේවයේ යෙදී සිටින අයදුම් කරුවන් එවන ඉල්ලුම් පත්, නියමිත දිනය ඉක්මවා ලැබුණහොත්, ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට එය ලැබී ඇත්තේ නියමිත කාල සීමාව තුළ නම් හා ප්‍රමාදයට ඒත්තු වන හේතු දක්වන්නේ නම් මිස එය පිළිගනු නො ලැබේ.

7. ඉල්ලුම් පත් හා ඒ සම්බන්ධ සෑම ලියවිල්ලක්ම එවිය යුත්තේ ගුවන් විදුලි සේවා අධ්‍යක්ෂ ජනරාල් නමට මිස මෙම දෙපාර්තමේන්තුවේ අන් කිසි නිලධාරියෙකුගේ පෞද්ගලික ලිපිනයට නොවේ .

8. මෙම ගැසට් පත්‍රයේ I වන කොටසේ (II) වන ඡේදයේ මුල පළවෙන රජයේ සේවයේ තනතුරුවලට පත් කිරීම් හා අදාළ පොදු කොන්දේසි බලන්න.

9. ඉල්ලුම් පත් ලැබුණු බව දන්වනු නො ලැබේ.

වී. ඊ. ගුණරත්න,
ගුවන් විදුලි සේවා අධ්‍යක්ෂ ජනරාල්.

1959 මාර්තු 26 වනදා.

## ඉල්ලුම් පත්‍රයේ ආදර්ශ ආකෘතිය

(1) සම්පූර්ණ නම (අච්චු අකුරෙන් ලියන්න)—
   (අ) වාසගම (හෙවත් අගට යෙදෙන නම) :————.
   (ආ) සෙසු නම් :————.

(2) ස්ථිර ලිපිනය :————.

(3) (අ) 1959 අප්‍රේල් 11 වැනි දිනට නියම වයස—
   අවුරුදු ............ මාස ............ දින ............
   (ආ) උපන් දිනය සහ තැන :————
   (උප්පැන්න සහතික පිටපත ඇමිණිය යුතුයි)

(4) ජාතිය :————.
   (1) ලාංකිකත්වය ලියා පදිංචි කිරීමෙන් ද, පෙළපතින් ද යන වග :————.
   (2) ලාංකිකත්වය පෙළපතින් නම් යට දැක්වෙන අය උපන් තැන දන්වන්න—
   (අ) අයදුම් කරු :————.
   (ආ) අයදුම් කරුගේ පියා :————.
   (ඉ) අයදුම් කරුගේ පියාගේ පියා :————.
   (ඊ) අයදුම් කරුගේ පියාගේ පියාගේ පියා :————.

(5) අධ්‍යාපනික සුදුසුකම් :————.
(ඉහත 5 (2) ඡේදයේ ප්‍රකාර සහතික පිටපත් අමුණන්න)

(6 ඉස්ලාම් ආගම, දශීණය, සංස්කෘතිය පිළිබඳ දැනුම—විස්තර කරන්න :————.

(7) ගුවන් විදුලි ප්‍රචාර කටයුතු සම්බන්ධයෙන් ඇති පළපුරුද්ද :
(මීට අමුණා ඇති සාක්ෂ්‍ය ලෙස ගැණෙන ලියවිලි කවරේද ?)
:————.

(8) අමුණා ඇති චරිත සහතික ලබාගත් අයගේ නම් සහ ලිපිනයන් :————.

(9) සේවා-මුක්ත හටයින් උදෙසා පිරිනැමෙන අනුග්‍රහයෙන් ප්‍රයෝජන ගන්නේද යන වග :————.

(10) රජය යටතේ කිසි විටෙක සේවය කර ඇත්නම් ඒ කවදා කොතැනද යන්න ? (එක් එක් දෙපාර්තමේන්තුවේ කළ සේවා කාලය දැක්විය යුතුයි) :————.

................................................
අයදුම්කරුගේ අත්සන.

දිනය :..................................

---

## බත්තුලුඹය සංචාරක නිවාස භාරකරුගේ තනතුර

ඉහත සඳහන් තනතුර සඳහා පුත්තලමේ ආණ්ඩුවේ ඒජන්ත තුමන් විසින් ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ.

2. මේ තනතුර සඳහා වාර්ෂික සපිර වේතනය රුපියල් 270කි. ඊට නියමිත තාවකාලික ජීවනාධාර සහ විශේෂ ජීවනාධාර මුදල් ආණ්ඩුවේ සංඛ්‍යා අනුව ලැබේ.

3. පත්වීම සපිරය. නමුත් විශ්‍රාම වැටුප් රහිතය.

4. සංචාරක නිවාස භාරකාර පදවිය සතියේ දින 7 තේම සේවයෙහි නිරතවිය යුතු පංක්තියට අයත් හෙයින් ආණ්ඩුවේ නිවාඩු දිනයන් පත්වීම කෙරේ බලපවත්වනු නොලැබේ.

5. ඉල්ලුම්කරුවන් 1959 ජූලි මස 1 වැනි දිනට වයස අවුරුදු 25ට අඩු නොවූ ලාංකිකයන් විය යුතුයි. සංචාරක නිවාස හෝ විවේකාගාර හෝ භෝජනාගාර හෝ එවැනි වෙනත් ආයතන පාලනය කර පලපුරුද්දක් ඇති අය පමණක් ඉල්ලුම් කළ යුතුයි. සිංහල හෝ දෙමළ කියවීමට හා ලිවීමටත් ඉංග්‍රීසි කථාකිරීමට හා තේරුම් ගැනිමටත් හැකි අය ගැන විශේෂයෙන් සලකනු ලැබේ. පෙරදිග හා අපරදිග ආහාර සකස් කිරීමේ පලපුරුද්ද අවශ්‍ය සුදුසු කමක් වන්නේය.

දනට ආණ්ඩුවේ සේවය කරන වයස අවුරුදු 40 ඉක්මගිය අයගේද ඉල්ලුම් පත්‍ර ගැන කල්පනා කරනු ලැබේ.

6. තෝරාගත් ඉල්ලුම්කරු තුන් අවුරුදු කාර්යපරීක්ෂණයට අයත් ය. එමෙන්ම ආණ්ඩුවේ විධි විධානද ඔහු කෙරේ බලපැවැත්වේ.

7. තෝරාගත් ඉල්ලුම්කරු තනතුර ඉසිලීමට යෝග්‍ය සෞඛ්‍ය තත්වයේ සිටින බැව් වෛද්‍ය පරීක්ෂණයකදී ඔප්පුවිය යුතුයි. තවද ඔහු අවුරුදු පතා වෛද්‍ය පරීක්ෂණයකට භාජන විය යුතුයි.

8. තෝරාගනු ලැබූ ඉල්ලුම්කරු විසින් රුපියල් 150ක ඇපයක් තැබිය යුතුයි. මෙය මුලින් රුපියල් 40ක් තැන්පත්කර ඉතිරි මුදල මාස්පතා රු. 5 බැගින් ගෙවා සම්පූර්ණ කළනැක.

9. තෝරාගත් ඉල්ලුම්කරු ඔහුගේ වැටුපෙන් සියයට 5ක් ප්‍රසිද්ධ සේවා අර්ථසාදක අරමුදල සඳහා යෙදිය යුතුයි.

10. ඉල්ලුම් පත්‍රයට පහත දක්වන ලියවිලි ඇමිනිය යුතුයි :—
(අ) බී 78 ඒ දරණ ආකෘති පත්‍රයේ නිකුත් කෙරෙන උප්පැන්න සහතිකය ;
(ආ) ඉගෙණීම පිළිබඳ සහතික ;
(ඉ) ගතිගුණ හා ක්‍රියා පිළිබඳ ළඟදී ලබාගත් සහතික තුනක.

11. දනට ආණ්ඩුවේ ආයතනවල සේවයේ සිටින්නන් විසින් ඉදිරිපත් කෙරෙන ඉල්ලුම් පත්‍ර භාරගනු ලබන්නේ ඒවා සවකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් එවුවහොත් පමණී.

12. ඉල්ලුම්කරු සුදුස්සෙකු බව පෙන්වීමට යමෙක් අරමුණු කරන්නේ නම් එය සහතිකයක් නිකුත් කිරීමෙන් කළ හැකිය. එක් ඉල්ලුම්කරුවකු තෝරා ගැනීම සඳහා යමෙකු උනන්දු කරවන්නේ නම් හෝ තෝරාගැනීම සඳහා සහාය ලබාදීමට උත්සාහ කරන්නේ නම් එය ඉල්ලුම්කරුගේ නුසුදුසු කමක් හැටියට සැලකෙනවා ඇත.

13. අසත්‍ය ප්‍රකාශයන් කිරීමෙන් ඉල්ලුම්කරු තෝරා ගැනීමේදී නුසුදුස්සෙක් වේ. එමෙන්ම පත්වීමෙන් පසුව එවැනි අසත්‍ය කාරණයක් එළිදරව් වුවහොත් තනතුරින් නෙරපා හරිනු ලැබේ.

14. ඉල්ලුම්කරුවන් නියම කරන ලද දිනකදී සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටිය යුතුයි. ඒ සඳහා ගමන් වියදම් හෝ වෙනත් දීමනා නොලැබේ.

15. මේ සමග ඇති උපලේඛනයෙහි දක්වෙන ආකෘති පත්‍රයේ පරිදි සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍ර 1959 මැයි මස 15 වැනි දින හෝ ඊට මත්තෙන් පුත්තලමේ ආණ්ඩුවේ ඒජන්තතුමා වෙත ලැබෙන සේ එවිය යුතුයි. කිසිම ඉල්ලුම් පත්‍රයක් පුද්ගලිකව මාවෙත නොඑවිය යුතුයි.

ජෝර්ජ් මැක්ස්වෙල් ස්පාර්ක්ස්,
පුත්තලම ආණ්ඩුවේ ඒජන්ත තුමා.

1959 මාර්තු මස 18 වැනි දින,
පුත්තලම් කච්චේරියේදීය.

### ආදර්ශ ආකෘති පත්‍රය

**බත්තුලුඹය සංචාරක නිවාසයේ භාරකරුගේ තනතුර සඳහා ඉල්ලුම් පත්‍රය**

1. සම්පූර්ණ නම :————.
(පැහැදිලි අකුරෙන්)

2. ලිපිනය :————.

3. ජාතිය :————.
(ලාංකික හෝ නොවෙද යන බව සඳහන් කරන්න)

4. ඉල්ලුම්කරු උපන් දිනය සහ ස්ථානය :————.

5. ඉල්ලුම්කරුගේ පියා උපන් දිනය සහ ස්ථානය :————.

6. ඉල්ලුම්කරු විවාහකද අවිවාහකද යන බව :————.
විවාහක නම් යැපෙන්නන්ගේ ගණන :————.

7. අධ්‍යාපන සුදුසුකම් :—
සමර්ථවූ අවසාන පාඨ පරීක්ෂණය සහ දිනය :————.

8. අධ්‍යාපනය ලත් ස්ථානය සහ අස්වූ දින :————.

9. (අ) පාසැලින් අස්වීමෙන් පසු කරන ලද රක්ෂා, දින හා සම්පූර්ණ විස්තර :————.
(ආ) කලින් ආණ්ඩුවේ රක්ෂාවක යෙදී සිටියා නම් ඒ පිළිබඳ විස්තර සහ රක්ෂාවෙන් ඉවත් වීමට හේතු :————.
(ඉ) මධ්‍යම ආණ්ඩු හෝ ප්‍රාදේශීය ආණ්ඩු පාලනයට යටත් සංචාරක නිවාසයක සේවය කරන්නෙහි නම් :—
(i) දනට දරණ තනතුරේ ශ්‍රෙණිය හා පත්වීමේ දිනය :————.
(ii) දනට ලබන වැටුප සහ වැටුප් ක්‍රමය :————.
(iii) සේවා සටහන් සහ දින :————.

10. සිංහල දැනීම, කියවීම, ලිවීම :————.
සිංහල සහ දෙමළ පරිවර්තනය කර කථා කිරීමේ දැනුම :————.

11. විශේෂ සුදුසුකම් පිළිබඳ විස්තර :————.

12. සහතික පත් ලබාගත් අයගේ නම් සහ තනතුරු :————.

13. විශේෂ ඉල්ලීම් හෝ සංචාරක/විවේකාගාර කටයුතු පිළිබඳ පලපුරුද්ද :————.

14. උසාවියකින් අපරාධ පිළිබඳ වරදකට දඬුවම් ලබා තිබේද ? එසේ නම් නඩුවේ අංකය, දිනය හා අපරාධයේ සවභාවය සටහන් කරන්න :————.

15. ණයතුරුස් වලින් නිදහස්ද යන බව :————.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**කුණ්ඩසාලේ කෘෂිකර්ම විද්‍යාලයයේ අවසාන පරීක්ෂණය**

**මාර්තු, 1959**

**කෘෂිකර්ම පංතිය :**

**පළමුවන පංතිය :** ඇස්. වෙල්මුරුගු ; ඩබ්ලිව්. ඇම්. ඩබ්ලිව්. නවරත්න.

**දෙවන පංතිය :** ඇස්. කතනගසබේ ; ඇස්. ඇම්. වන්සේකර ; ආර්. ඇල්. ඇම්. ඇස්. එම්මානුවෙල් ; එච්. බිසෝමැණිකේ ; ඇස්. ඩී. පෙරේරා ; ජී. මේරි රෝස්.

**සාමාන්‍ය :** පී. ඇස්. රාජපක්ෂ ; ඒ. සෙබමලෙයි ; ඩී. වී. කේ. ද සොයිසා.

**ගෘහ පාලන පිළිබඳ පංතිය :**

**පළමුවන පංතිය :** ඇන්. එච්. පතියන්ඩුවගේ.

**දෙවන පංතිය :** ඩබ්ලිව්. ඩී. පිලෝමිනා ; අයි. යටවර ; ඇස්. ඇල්. පිලිමතලාව ; ඇස්. ඇල්. ඒ. අබේරත්න ; වී. ඇම්. ඇල්ලෙපොල ; පී. හේරත් ; ආර්. වී. නානායක්කාර ; පී. වරාගොඩ ; ආර්. ඇස්. ඩී. පෙරේරා ; කේ. ඩී. ඇම්. කේ. බණ්ඩාර ; ඇස්. ඇස්. ජයවර්ධන ; සී. වී. බණ්ඩාරනායක.

**සාමාන්‍ය :** ඩබ්ලිව්. කුරුප්පු ; සී. බී. සීමම්පිල්ලෙයි ; ඊ. පරමෙස්වර දේවී ; ඩබ්ලිව්. ඉල්ලපෙරුම ; එච්. ඉල්ලපෙරුම ; ආර්. තම්බු ; ඇම්. උනම්බුව ; ඩී. ප්‍රනාන්දු ; ඇන්. සතාසිවම්.

**මැහුම්වලින් ඌන සාමර්ථ්‍යය ලැබුවෝ :** ඇම්. ඇන්. දෙඩන්වෙල ; ජේ. ඇම්. වීරසේකර.

---

# ටැන්ඩර් කැඳවීමේ දැන්වීම්

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

**වාරියපොල ගොවිපලට කහ උනබම්බු පෝච්චි සහ වල් අඹගෙඩි සැපයීම**

වාරියපොල කෘෂිකර්ම කායශාලයේ (කුරුණෑගල සහ පුත්තලම දිස්ත්‍රික්ක භාර) පරිපාලක නිලධාරිතැන විසින්, පහත සඳහන් දේවල් සඳහා ටෙන්ඩර් පත්‍ර 1959 අප්‍රේල් මස 16 වෙනි දින පස්වරු 2.30 වනතෙක් භාරගනු ලැබේ :—

(1) බාහිර විෂ්කම්භය 3"ක් වූද දිග 10"ටත් 14" අතර වූද හොඳට පැසුණු කහ උණබම්බු 10,000ක් ; හා

(2) හොඳට පැසුණු වල් අඹගෙඩි 5,000ක් වාරියපොල ගොවිපලට සැපයීම. මේවා ළඟම තිබෙන දුම්රියපලට ගෙනැවිත් භාර දීම සඳහා මිල ගණන් හා වාරියපොලට ගෙනැවිත් භාරදීම සඳහා මිල ගණන් වෙන වෙනම ටෙන්ඩර් පත්‍රවල ලකුණු කරුණු මැනවි.

2. වාරියපොල කෘෂිකර්ම කායශාලයේ (කුරුණෑගල සහ පුත්තලම දිස්ත්‍රික්ක භාර) පරිපාලන නිලධාරිතැනගෙන් පෝරම කොළ ලබා ගෙන ටෙන්ඩර් පත්‍ර ඒවායෙහි එව්ය යුතුයි. සියළුම ටෙන්ඩර් පත්‍ර (පිටපත් දෙකක්) ලියුම් කවරයක දමා සීල් තබා " කුරුණෑගල සහ පුත්තලම දිස්ත්‍රික්ක භාර පරිපාලන නිලධාරිතැන, කෘෂිකර්ම කායශාලය, වාරියපොල " යන්න එහි පිට ලියා එහිම මුදුනේ වම් කෙළවරෙහි " වාරියපොල ගොවිපලට කහ උනබම්බු පෝච්චි/වල් අඹ * සැපයීමේ ටෙන්ඩර් " යන්න ලියා එව්ය යුතුයි. එක එක කායශීයට වෙන වෙනම ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි.

3. ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දින දවල් 12 වනතෙක් ටෙන්ඩර් පෝරම දෙනු ලැබේ. ඒ දීම කරන්නේ එක් එක් ටෙන්ඩර් පත්‍රයක් වෙනුවෙන් රුපියල් දහයක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ පසුවය. මේ තැන්පත් කිරීම කච්චේරියක හෝ මහා භාණ්ඩාගාරයේ හෝ කළ යුතුයි. පොරොන්දු පත්‍රය අත්සන්කළ පසු ටෙන්ඩර් තැන්පත් මුදල ආපසු දෙනු ලැබේ.

පත්කරගනු ලැබූ ටෙන්ඩර්කරුවාට ඔහුගේ ටෙන්ඩර් පත්‍රය පිළිගත් බව දන්වා දින 10ක් ඇතුළත දී අවශ්‍ය ඇපය තැබීමට හෝ පොරොන්දු පත්‍රය අත්සන් කිරීමට හෝ නොහැකිවුවහොත් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක වෙනවාත් හැර ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත්වන්ට ඉඩ තිබේ.

4. ටෙන්ඩර් පත්‍ර රිජිස්ටර් තැපෑලෙන් එව්ය යුතුයි. ටෙන්ඩර් පත්‍ර රිජිස්ටර් තැපෑලෙන් නොඑවතොත් ටෙන්ඩර් කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයින් හෝ විසින් වාරියපොල කෘෂිකර්ම කායශාලයේ පරිපාලන නිලධාරි තැනට ඒවා අතින්ම භාරදිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර බහාලන ලද කවරයෙහි " වාරියපොල ගොවිපලට කහ උනබම්බු පෝච්චි/වල් අඹ * සැපයීමේ ටෙන්ඩර් " යන්න ලියා ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනයද සඳහන් කළ යුතුයි. රිජිස්ටර් තැපෑලෙන් එවන ලද ටෙන්ඩර් පත්‍ර ලැබුණු බව ඒවා විවෘත කරන දිනයේදීම සියළුම ටෙන්ඩර් කරුවන්ට දන්වනු ලැබේ. ටෙන්ඩර්පත්‍ර භාර ගැනීම නැවැත්වීමට නියමිත දින සිට දින හතරක් ඇතුළත යම් ටෙන්ඩර් කරුවෙකුට එවැනි දැන්වීමක් නොලැබුණොත් ඔහු වාරියපොල කෘෂිකර්ම කායශාලයේ පරිපාලන නිලධාරි තැනගෙන් වහාම ඒ ගැන කරුණු විමසිය යුතුයි.

5. ටෙන්ඩර්කරුවන්ට උවමනා නම් ටෙන්ඩර් විවෘත කරන වේලාවේදී ඉදිරියෙහි සිටීමට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් භාරගැණීම නැවැත්වීමට නියමිත යටකී දිනයේ යටකී වේලාවේ දී, වාරියපොල කෘෂිකර්ම කායශාලයේදී ඒවා විවෘත කරනු ලැබේ.

6. නියමිත පෝරමයේ ලියා නැති, නැතහොත් එහි නියමිත කොන්දේසි සම්පූර්ණ වශයෙන් ඉටුවී නැති කිසිම ටෙන්ඩර් පත්‍රයක්, ටෙන්ඩර් පත්‍රයක් ලෙස සලකනු නොලැබේ. ටෙන්ඩර් ප්‍රමාණයන් සහ ගණන් පැහැදිලි ලෙස තීන්තෙන් ලකුණු කළයුතුවාක් හැර ඒවා සම්බන්ධයෙන් යම්කිසි වෙනසක් කළහොත් ඒ තැන්වල ටෙන්ඩර් කරුවාගේ කෙටි අත්සන තැබිය යුතුද වේ.

7. ටෙන්ඩර්කරුවන් නම ලිපිනය පැහැදිළි අකුරින් ටෙන්ඩර් පත්‍රයෙහි ලිවිය යුතුයි.

8. ටෙන්ඩර් පත්‍රයේ සඳහන්වූ ද පිළිගනු ලැබුවාවූ ද දේවල මුළු වියදමින් සියයට පහක ඇප මුදලක් කෘෂිකර්ම අධ්‍යක්ෂතැනගේ නමින් තැන්පත් කිරීමටත් පොරොන්දු පත්‍රයක් අත්සන් කිරීමටත් පත්කර ගනු ලැබූ ටෙන්ඩර්කරුවාට නියම කරණු ලැබේ. මේ මුදල ආපසු දෙන්නේ කොන්ත්‍රාත්තුව නිසි පරිදි ඉටුකොට නිමවූ විට පමණකි. පත්කරගනු ලැබූ ටෙන්ඩර් කරුවා මේ කොන්ත්‍රාත්තුව ඉටු නොකළ හොත් ඔහුගේ ඇප මුදල රාජසන්තක වෙනවාත් හැර ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වෙනවාද ඇත.

9. ගිවිසුම් පත්‍රයට හෝ පොරොන්දු පත්‍රයට ඇලවියයුතු මුද්දරවල වටිනාකම පත්කරගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් ගෙවිය යුතුයි.

10. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් කරණ සියළුම මිල ගණන් යටත් පිරිසෙයින් සති තුනකටවත් වෙනස් නොවන සථිර ඒවා විය යුතුයි.

11. යම්කිසි ටෙන්ඩර් පත්‍රයක් හෝ සියළුම ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂෙප කිරීමේත්, ටෙන්ඩර් පත්‍රයක යම් කිසි කොටසක් පිළිගැනීමේත් බලය කෘෂිකර්ම අධ්‍යක්ෂක වෙත තබාගනු ලැබේ.

12. පත්කරගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් වැඩය කිරීම සඳහා ලාංකික කම්කරුවන් පමණක් ගත යුතුයි. "ලාංකිකයා" යන වචනයේ අර්ථය නම් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ලංකාවේ පුරවැසියෙක් වූ තැනැත්තෙක් ය යන්නයි.

13. කොන්ත්‍රාත්කාරයාට භාරදියයුතු සියලු දැන්වීම් ඔහුගේ අතට දුන්නොත් හෝ ඔහු විසින් සඳහන්කර ඇති ලිපිනයට තැපෑලෙන් යැව්වොත් හෝ ඔහුගේ අතටම භාරදුන්නා ලෙස සලකනු ලැබේ.

14. 1934රේ 19 වැනි අංකය දරණ කම්කරු වන්දි ආඥපනත (117 වෙනි පරිච්ඡෙදය) යටතේ තමාගේ යම්කිසි සේවකයෙකු හෝ සේවකයෙකු වෙනුවෙන් වන්දි ඉල්ලා එවන ඉල්ලුම් පත්‍ර ගැන වග කීමෙන් කොන්ත්‍රාත්කරුවා විසින් ආණ්ඩුව නිදහස් කළ යුතුයි.

15. වැඩට ගැණීමට නුසුදුසුයයි කල්පනා කරණු ලබන යම්කිසි කම්කරුවෙකු කොන්ත්‍රාත්කරුවා වැඩට ගැනීම ගැන විරුද්ධවීමේ හෝ ඕනෑම කම්කරුවෙකු වැඩට ගැනීම ගැන විරුද්ධවීමේ හෝ බලය ආණ්ඩුව වෙත තබාගනු ලැබේ.

16. වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවට තනි තනිව හෝ ඒ ලැයිස්තුවේ නම සඳහන් වෙන කෙනෙකුගේ නම සමග හෝ නම ඇතුළත් වූ හෝ තමාට සෑහේ යයි පෙනී යන හේතු පිට කෘෂිකර්ම අධ්‍යක්ෂ තැන විරුද්ධවන හෝ කිසිවකු සමග කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

17. වැඩි විස්තර වාරියපොල ගොවිපලේ කළමනාකාර තැනගෙන් ලබාගත හැක.

* අනවශ්‍ය වචන කපාහරින්න.

ඇම්. ඇෆ්. චන්ද්‍රරත්න,
කෘෂිකර්ම අධ්‍යක්ෂ.

1959 මාර්තු මස 13 වෙනි දින,
පේරාදෙණියේදීය.

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

**කන්තලේ උක් වගාවට ප්‍රීන්ච් එන්ඩ් ලෝඩර තුනක් සැපයීම**

1959 මාර්තු මස 6 වැනි දින අංක 11,691 දරණ රජයේ ගැසට් පතෙහි පළවූ ඉහත සඳහන් ටෙන්ඩර පිළිබඳව ටෙන්ඩර් පත්‍ර භාර ගන්නා අවසාන දිනය 1959 අප්‍රේල් මස 17 වැනි දින අපරභාග 2.30 දක්වා දීර්ඝ කරන ලදී.

ඇම්. ඇෆ්. චන්ද්‍රරත්න,
කෘෂිකර්ම අධ්‍යක්ෂ.

මාර්තු 21, 1959,
පේරාදෙනිය.

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

**කන්තලේ රජයේ උක් වගාවට ටොන් 5හේ බර කායශී (හෙවිඩියුටි) සඳහා ට්‍රේලර් රථ 5ක් සැපයීම**

1959 මාර්තු මස 6 වැනි දින අංක 11,691 දරණ රජයේ ගැසට් පතෙහි පළවූ ඉහත සඳහන් ටෙන්ඩරය පිළිබඳව ටෙන්ඩර් පත්‍ර භාර ගන්නා අවසාන දිනය 1959 අප්‍රේල් මස 17 වැනි දින් පස්වරු 2.30 දක්වා දීර්ඝ කරන ලදී.

ඇම්. ඇෆ්. චන්ද්‍රරත්න,
කෘෂිකර්ම අධ්‍යක්ෂ.

මාර්තු 21, 1959,
පේරාදෙනිය.

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

වාරියපොල, කුරුණෑගල සහ පුත්තලම දිස්ත්‍රික්ක භාර පරිපාලන නිලධාරිතැන විසින් වාරියපොල ගොවිපලෙහි ඇති පොල් 17,000ක් පමණ විකිණීම සඳහා සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර 1959 අප්‍රේල් මස 23 වෙනි දින පස්වරු 2.30 වන තුරු භාරගනු ලැබේ.

2. කුරුණෑගල සහ පුත්තලම දිස්ත්‍රික්ක භාර පරිපාලන නිලධාරි තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ඒවායෙහි එවිය යුතුයි. සියලුම ටෙන්ඩර් පත්‍ර ලියුම් කවරයක දමා සීල් තබා "කුරුණෑගල සහ පුත්තලම දිස්ත්‍රික්ක භාර පරිපාලන නිලධාරි තැන, කෘෂිකර්ම කාර්යාලය, වාරියපොල" යන්න එහි පිට ලියා එහි මුදුනේ වම් කොනෙහි "වාරියපොල ගොවිපොලේ පොල් සඳහා ටෙන්ඩර්" යන්න සඳහන් කළ යුතුයි. සියලුම ටෙන්ඩර් පත්‍ර අනුපිටපතක්ද සහිතව සීල් තබන ලද කවරය තුළ බහා ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුයි.

3. ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචි කළ තැපෑලෙන් නො එවතොත් ටෙන්ඩර්කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් හෝ විසින් කුරුණෑගල සහ පුත්තලම දිස්ත්‍රික්ක භාර පරිපාලන නිලධාරිතැනට ඒවා අතින්ම භාර දිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර බහාලන ලද කවරයේ "වාරියපොල ගොවිපලෙහි පොල් සඳහා ටෙන්ඩර්" යන්න ලියා ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනයද සඳහන් කළ යුතුය.

4. ලියා පදිංචි කළ තැපෑලෙන් එවන ලද ටෙන්ඩර් පත්‍ර ලැබුණ බව ඒවා විවෘත කරන දිනයේදීම සියලුම ටෙන්ඩර්කරුවන්ට දන්වනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම නැවැත්වීමට නියමිත දින සිට දින 4ක් ඇතුළත යම් ටෙන්ඩර්කරුවෙකුට එවැනි දැන්වීමක් නොලැබුණොත් ඔහු කුරුණෑගල සහ පුත්තලම් දිස්ත්‍රික්ක භාර පරිපාලන නිලධාරිතැනගෙන් වහාම ඒ ගැන කරුණු විමසිය යුතුයි.

5. ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දින දවල් 12 වන තෙක් ටෙන්ඩර් පෝර්ම දෙනු ලැබේ. ඒ දීම කරනු ලබන්නේ පොල් සඳහා ටෙන්ඩර් පත්‍රය වෙනුවෙන් රුපියල් 25ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ පසුවය. මේ තැන්පත් කිරීම කච්චේරියක හෝ මහා භාණ්ඩාගාරයේ හෝ කළ යුතුයි. පත්කරගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් දින දහයක් ඇතුළත මුළු පොල් තොගයටම සම්පූර්ණ මුදල් ගෙවා ඒවා ඉවත්කර ගත යුතුයි. එසේ නොහැකි වුවහොත් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක වෙනවාත් හැර ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වන්නට ඉඩ තිබේ.

6. නියමිත පෝරමයේ ලියා නැති නැතහොත් එහි නියමිත කොන්දේසි සම්පූර්ණ වශයෙන් ඉටුවී නැති කිසිම ටෙන්ඩර් පත්‍රයක් ටෙන්ඩර් පත්‍රයක් ලෙස සලකනු නොලැබේ. ටෙන්ඩර් ප්‍රමාණයන් සහ ගණන් පැහැදිළි ලෙස තීන්තෙන් ලකුණු කළ යුතුවාත් හැර ඒවා සම්බන්ධයෙන් යම්කිසි වෙනසක් කළහොත් ඒ තැන්වල ටෙන්ඩර්කරුවාගේ කෙටි අත්සන තැබිය යුතු වේ.

7. ටෙන්ඩර්කරුවන් තම ලිපිනය පැහැදිළි අකුරෙන් ටෙන්ඩර් පත්‍රයෙහි ලිවිය යුතුයි.

8. යම්කිසි ටෙන්ඩර් පත්‍රයක් හෝ සියළුම ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂෙප කිරීමේත් ටෙන්ඩර් පත්‍රයක යම්කිසි කොටසක් පිළිගැණීමේත් බලය කෘෂිකර්ම අධ්‍යක්ෂක වෙත තබාගනී.

9. පත්කරගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් වැඩය කිරීම සඳහා ලාංකික කම්කරුවන් පමණක් ගත යුතුයි. "ලාංකිකයා" යන වචනයේ අර්ථය නම් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැණීමෙන් හෝ ලංකාවේ පුරවැසියෙක් වූ තැනැත්තෙක්ය යන්නයි.

10. 1934රේ 19 වැනි අංකය දරණ කම්කරු ආඥපනත (117 වැනි පරිච්ඡේදය) යටතේ තමාගේ යම්කිසි සේවකයෙකු හෝ සේවකයෙකු වෙනුවෙන් වන්දි ඉල්ලා එවන ලද ඉල්ලුම් පත්‍ර ගැන වගකීමෙන් කොන්ත්‍රාත්කරුවා ආණ්ඩුව නිදහස් කළ යුතුයි.

11. කොන්ත්‍රාත්කාරයාට භාරදිය යුතු සියළු දැන්වීම් ඔහුගේ අතට දුන්නොත්, නැතහොත් ඔහු විසින් සඳහන් කර ඇති ලිපිනයට තැපෑලෙන් යැව්වොත් ඔහු අතටම භාර දුන්නා කොට සැලකිය යුතුයි.

12. වැඩට ගැනීමට නුසුදුසු යයි කල්පනා කරනු ලබන යම්කිසි කම්කරුවෙකු කොන්ත්‍රාත්කරුවා වැඩට ගැනීම ගැන විරුද්ධවීමේ හෝ ඕනෑම කම්කරුවෙකු වැඩට ගැනීම ගැන විරුද්ධවීමේ බලය ආණ්ඩුවට තබාගනු ලැබේ.

13. වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවට තනිතනිව හෝ එම ලැයිස්තුවේ නම සඳහන් වෙන කෙනෙකුගේ නම සමග හෝ නම ඇතුළත්වූ හෝ තමාට සැහේයයි පෙනී යන හේතු පිට කෘෂිකර්ම අධ්‍යක්ෂකතැන විරුද්ධවන හෝ කිසිවකු සමග කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

14. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් කරණු ලබන මිල ගණන් යටත් පිරිසෙයින් සතී 3කටවත් වෙනස් නොවන සපිර ඒවා විය යුතුයි.

15. පිළිගත් ටෙන්ඩර්කරු ඔහුගේ ටෙන්ඩරය භාරගත් බව දන්වන ලිපිය ලැබී දින 10ක් ඇතුළත පොල්වලට ගෙවා ඉවත්කර ගත යුතුයි.

16. පිළිගත් ටෙන්ඩර්කරු පොල් සියල්ලටම සම්පූර්ණ මුදල ගෙවා ඉවත් කරගත යුතුයි. පොල් තෝරා ඉන් සමහරක් ප්‍රතික්ෂෙප කිරීමට ඉඩ දෙනු නොලැබේ.

17. මේ පිළිබඳ වැඩි විස්තර වාරියපොල ගොවිපල භාර කළමනාකාර තැනගෙන් දැනගත හැක.

ඇම්. ඇෆ්ජ්. චන්ද්‍රරත්න,
කෘෂිකර්ම අධ්‍යක්ෂකතැන.

1959 මාර්තු මස 18 වෙනි දින,
පේරාදෙණියේ දීය.

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### හිඟුරක්ගොඩ රජයේ ගොවිපළේ ගොයම් පැළ සිටවීම

පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසින් හිඟුරක්ගොඩ රජයේ ගොවිපළේ අක්කර 100ක මුරුංගාකායම් 302 යන වර්ගයේ ගොයම් පැළ සිටවීම සඳහා ටෙන්ඩර් පත්‍ර 1959යේ අප්‍රේල් මස 16 වැනි දින පස්වරු 2.30 වනතෙක් භාරගනු ලැබේ.

ගොයම් පැළ සිටවීම පහත සඳහන් අන්දමට කළ යුතුයි :—

(අ) තවානේ ගොයම් පැළවලට හානියක් නොවන අන්දමට පැළ උදුරා මඩ සෝදා අඟල් 12-14ට මහත සිටින සේ මිටි බැඳීම.

(ආ) එම මිටි ගොවිපලෙන් සපයන වාහනයකට පැටවීම.

(ඉ) පැළ සිටවීමට නියම කර තිබෙන කුඹුර ළඟ පැළ බෑම, එම පැළ ඉන්දවීමට නියමිත කුඹුර ගොවිපළ භාරකාර තැන විසින් පෙන්වනවා ඇත. පැල සිටවීමේදී අඟලකට (1") වඩා ගැඹුරට පස යට නොකළ යුතුයි. දිනක උදුරන ලද පැල සියල්ලම පැය 24ක් ඇතුළතදී කුඹුරේ ඉන්දවා නිම කළ යුතුයි.

(ඊ) ගොයම් පැල පේලි දිගේ පේලියෙන් පේලියට අඟල් 10ක පරතරය ඇතුවද පේලිය දිගේ අඟල් 5ටත් 6ටත් පරතරය ඇතුවද සිටවිය යුතුයි.

(උ) දිනකට අක්කර 5ට වැඩි කුඹුරු ප්‍රමාණයක පැළ සිටවීම කළ යුතුයි.

(ඌ) අප්‍රේල් මස 17 වැනි දින සිට මැයි මස 3 වැනි දින දක්වා කාලය තුළදී පැළ ඉන්දවා නිම කළ යුතුයි.

2. පොළොන්නරුවේ කෘෂිකර්ම කායසීලයේ පරිපාලන නිලධාරි තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ඒවායෙහි එවිය යුතුයි. සියලුම ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙකක් සහිතව, ලියුම් කවරයක දමා සීල් තබා "සභාපති තුමා, ටෙන්ඩර් මණ්ඩලය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙනිය" යන්න එහි පිට ලියා එහිම මුදුනේ වම් කෙළවරෙහි "හිඟුරක්ගොඩ රජයේ ගොවිපලේ ගොයම් පැළ සිටවීම සඳහා ටෙන්ඩර්" යන්න ලියා එවිය යුතුයි.

3. ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දින දවල් 12 වනතෙක් ටෙන්ඩර් පෝර්ම දෙනු ලැබේ. ඒ දීම කරන්නේ ටෙන්ඩර් පත්‍රය වෙනුවෙන් රුපියල් 10ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ පසුවය.

මේ තැන්පත් කිරීම කච්චේරියක හෝ මහා භාණ්ඩාගාරයේ හෝ කළ යුතුයි. පොරොන්දු පත්‍රය අත්සන් කළ පසු ටෙන්ඩර් තැන්පත් මුදල ආපසු දෙනු ලැබේ.

පත්කරගනු ලැබූ ටෙන්ඩර්කරුවාට ඔහුගේ ටෙන්ඩර් පත්‍රය පිළිගත් බව දන්වා දින 5ක් ඇතුළතදී අවශ්‍ය ඇපය තැබීමට හෝ පොරොන්දු පත්‍රය අත්සන් කිරීමට හෝ නොහැකි වුවහොත් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක වෙනවාත් හැර ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත්වන්ට ඉඩ තිබේ.

4. ටෙන්ඩර් පත්‍ර රිජිස්ටර් තැපෑලෙන් එවිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර රිජිස්ටර් තැපෑලෙන් නොඑවතොත් ටෙන්ඩර්කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් හෝ විසින් පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් කටයුතු ලිපිකරුට ඒවා අතින්ම භාරදිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර බහාලන ලද කවරයෙහි "හිඟුරක්ගොඩ රජයේ ගොවිපලේ ගොයම් පැළ සිටවීම සඳහා ටෙන්ඩර්" යන්න ලියා ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනයද සඳහන් කළ යුතුයි. රෙජිස්ටර් තැපෑලෙන් එවනලද ටෙන්ඩර් පත්‍ර ලැබුණු බව ඒවා විවෘත කරන දිනයේදීම සියලු ටෙන්ඩර් කරුවන්ට දන්වනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාරගැනීම නැවැත්වීමට නියමිත දින සිට දින හතරක් ඇතුළත යම් ටෙන්ඩර්කරුවෙකුට එවැනි දැන්වීමක් නොලැබුනොත් ඔහු පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමාගෙන් වහාම ඒ ගැන කරුණු විමසිය යුතුයි.

5. ටෙන්ඩර්කරුවන්ට වුවමනා නම් ටෙන්ඩර් විවෘත කරන වේලාවේදි ඉදිරියෙහි සිටීමට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් භාර ගැනිම නැවැත්වීමට නියමිත යටකී දිනයේ යටකී වේලාවේදී පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කායර්‍යාලයේදී ඒවා විවෘත කරනු ලැබේ.

6. නියමිත පෝර්මයේ ලියා නැති නැතහොත් එහි නියමිත කොන්දේසි සම්පූර්ණ වශයෙන් ඉටුවී නැති කිසිම ටෙන්ඩර් පත්‍රයක්, ටෙන්ඩර් පත්‍රයක් ලෙස සලකනු නොලැබේ. ටෙන්ඩර් ප්‍රමාණයන් සහ ගණන් පැහැදිලි ලෙස තීන්තෙන් ලකුණු කළ යුතුවාත් හැර ඒවා සම්බන්ධයෙන් යම්කිසි වෙනසක් කළහොත් ඒ තැන්වල ටෙන්ඩර් කරුවාගේ කෙටි අත්සන තැබිය යුතුද වේ.

7. ටෙන්ඩර්කරුවන් තම ලිපිනය පැහැදිලි අකුරින් ටෙන්ඩර් පත්‍රයෙහි ලිවිය යුතුයි.

8. ටෙන්ඩර් පත්‍රයේ සඳහන්වූද පිළිගනු ලැබුවාවූද දේවල මුළු වියදමෙන් සියයට පහක ඇප මුදලක් කෘෂිකර්ම අධ්‍යක්ෂ තැනගේ නමින් තැන්පත් කිරීමටත් පොරොන්දු පත්‍රයක් අත්සන් කිරීමටත් පත්කරගනු ලැබූ ටෙන්ඩර්කරුවාට නියම කරනු ලැබේ. මේ මුදල ආපසු දෙන්නේ මේ කොන්ත්‍රාත්තුව නිසි පරිදි ඉටු කොට නිමවූ විට පමණකි. පත්කරගනු ලැබූ ටෙන්ඩර්කරුවා මේ කොන්ත්‍රාත්තුව ඉටු නොකළහොත් ඔහුගේ ඇප මුදල රාජසන්තක වෙනවා පමණක් නොව ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වෙනවාද ඇත.

9. ටෙන්ඩර් පත්‍රයට ඇලවිය යුතු මුද්දරවල වටිනාකම පත්කරගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් ගෙවිය යුතුයි.

10. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් කරන මිළ ගණන් යටත් පිරිසෙයින් සති 3කටවත් වෙනස් නොවන ස්ථිර ඒවා විය යුතුයි.

11. යම්කිසි ටෙන්ඩර් පත්‍රයක් හෝ සියලුම ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂෙප කිරීමේත් ටෙන්ඩර් පත්‍රයක යම්කිසි කොටසක් පිළිගැනීමේත් බලය කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙත තබාගනු ලැබේ.

12. පත්කරගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් වැඩය කිරීම සඳහා ලාංකික කම්කරුවන් පමණක් ගත යුතුය. "ලාංකිකයා" යන වචනයේ අර්ථය නම් පරම්පරාවෙන් හෝ ලියාපදිංචිකරවා ගැනීමෙන් හෝ ලංකාවේ පුරවැසියෙක්වූ තැනැත්තෙක්ය යන්නයි.

13. කොන්ත්‍රාත්කාරයාට භාරදිය යුතු සියලු දැන්වීම් ඔහුගේ අතට දුන්නොත් හෝ ඔහු විසින් සඳහන් කර ඇති ලිපිනයට තැපෑලෙන් යැව්වොත් හෝ ඔහුගේ අතටම භාරදුන්නා ලෙස සලකනු ලැබේ.

14. 1934රේ 19 වැනි අංකය දරන කම්කරු වන්දි ආඥාපණත (117 වැනි පරිච්ඡෙදය) යටතේ තමාගේ යම්කිසි සේවකයෙකු හෝ සේවකයෙකු වෙනුවෙන් වන්දි ඉල්ලා එවන ඉල්ලුම් පත්‍ර ගැන වග කීමෙන් කොන්ත්‍රාත්කරුවා විසින් ආණ්ඩුව නිදහස් කළ යුතුයි.

15. වැඩට ගැනීමට නුසුදුසුයයි කල්පනා කරනු ලබන යම්කිසි කම්කරුවෙකු කොන්ත්‍රාත්කරුවා වැඩට ගැනීම ගැන විරුද්ධවීමේ හෝ ඕනෑම කම්කරුවෙකු වැඩට ගැනීම ගැන විරුද්ධ වීමේ හෝ බලය ආණ්ඩුව වෙත තබා ගනු ලැබේ.

16. වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවට තනි තනිව හෝ ඒ ලැයිස්තුවේ නම් සඳහන් වෙන කෙනෙකුගේ නම සමග හෝ නම ඇතුළත්වූ හෝ තමාට සැහේයයි පෙනී යන හේතුපිට කෘෂිකර්ම අධ්‍යක්ෂ තැන විරුද්ධ වන හෝ කිසිවකු සමග කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

17. වැඩි විස්තර හිඟුරක්ගොඩ රජයේ ගොවිපලේ කළමනාකාර තැනගෙන් දැනගත හැක.

ඇම්. ඇෆ්. චන්ද්‍රරත්න.
කෘෂිකර්ම අධ්‍යක්ෂ.

1959යේ මාර්තු මස 16 වැනි දින,
පේරාදෙනියේදිය.

---

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

### අනුරාධපුර හා කුරුණෑගල දිස්ත්‍රික්කවල ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ව්‍යාපාරවල ගොඩනැගිලි සෑදීමට අවශ්‍ය බඩු බාහිරාදිය සැපයීම

අනුරාධපුරයේ ඉඩම් සංවර්ධන නිලධාරි තැන විසින් ඉහත සඳහන් දිස්ත්‍රික්කවල පිහිටි ඉඩම් සංවර්ධන ව්‍යාපාරයන්ට අවශ්‍ය පහත දක්වන බඩු බාහිරාදිය සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර 1959 අප්‍රේල් මස 17 වැනි දින පෙරවරු 9.30 දක්වා භාරගනු ලැබේ.

(1) ගඩොල් ප්‍රමාණය : $8\frac{3}{4}'' \times 4\frac{1}{4}'' \times 2\frac{3}{4}''$ විය යුතුයි.

(2) කළුගල් ප්‍රමාණය : 6"—9" විය යුතුයි. කියුබ් ගණනින්.

(3) අළුහුණු බුසල් ගණනින් : බුසලක් රාත්තල් 44ට අඩු නොවිය යුතුයි.

(4) තම්බපු හුණු : බුසල් ගණනින්.

(5) පොල් අතු : ඉරු දෙක බැගින් වියන ලද ඒවා. දිගින් අඩි 7ටත් පළලින් අඩි $1\frac{1}{2}$ටත් අඩු නොවිය යුතුයි.

(6) තලාපු කළුගල් : 1", $\frac{3}{4}$", $1\frac{1}{2}$", 2" කියුබ් ගණනින්.

2. එක් එක් ව්‍යාපාරයන්ට බඩු සැපයීම සඳහා වෙන වෙනම ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි.

3. 1959.4.7 දින හෝ ඊට කලින් අනුරාධපුර ඉඩම් සංවර්ධන නිලධාරි තැනගේ කාර්යාලයෙන් ලබාගත හැකි පෝරමවල ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතකුත් සහිතව ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුතුයි. එක ටෙන්ඩර් පත්‍රයකට රු. 50ක් බැගින් ඇප මුදල් අනුරාධපුර කච්චේරියෙහි හෝ වෙනයම් කච්චේරියක තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් පසු අවශ්‍ය ටෙන්ඩර් පත්‍රිකා ලබාගත හැකිය.

4. අනුරාධපුර ඉඩම් සංවර්ධන නිලධාරි තැනගේ කාර්යාලයේදී 1959.4.7 දින පෙරවරු 9.30ට ටෙන්ඩර් පත්‍රිකා විවෘත කරණු ලැබේ. අවශ්‍ය නම් මේ අවස්ථාවේ ටෙන්ඩර්කරුවන්ට පැමිණ සිටිය හැකිය.

මේ සඳහා සම්පූර්ණ විස්තර අනුරාධපුර ඉඩම් සංවර්ධන නිලධාරි තැනගෙන් ලබාගත හැකිය.

කේ. බී. රත්නායක,
ඉඩම් සංවර්ධන නිලධාරි තැන.

අනුරාධපුර ඉඩම් සංවර්ධන කාර්යාලයේ දීය.
1959 මාර්තු මස 16 වැනි දින,

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

කොළඹ 8, කොටා රෝඩ්හි බස්නාහිර කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරුතුමා විසින් කෑගලු දිස්ත්‍රික්කයේ කිතුල්ගල පිහිටි ගිරන්කිත්ත අමුණ තැනීම සඳහා මෙම දෙපාර්තමේන්තුවේ රු. 6,500ක හෝ ඊට වැඩි ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ගෙන් සීල් තැබූ ටෙන්ඩර් පත්‍ර 1959 අප්‍රේල් මස 17 වැනි සිකුරාදා පෙ. ව. 11.30 දක්වා බාරගනු ලැබේ.

මේ පිළිබඳ වැඩි විස්තර, සැලැස්ම හා ටෙන්ඩර් පත්‍ර අත්තනගලු ඔය යෝජනා ක්‍රමයේ උප ප්‍රාදේශීය වාරිමාර්ග නිලධාරිතුමන් වෙතින් ලබාගත හැකි අතර ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙක බැගින් එවිය යුතුයි.

ටෙන්ඩර් පත්‍ර 1959 අප්‍රියෙල් 15 වැනි බදාදා දක්වා මෙම කායර්‍යාලයේ රාජකාරිය කරන වේලාවන් අතරතුරදී ලබාගත හැක. ඒ සඳහා ඕනෑම කච්චේරියක හෝ මෙම කායර්‍යාලයෙහි රු. 25ක මුදලක් තැන්පත් කොට ලබාගත් කුයිතාන්සියක් තම සුදුසුකම් සමග ඉදිරිපත් කළ යුතුයි.

ටෙන්ඩර් පත්‍ර ඉල්ලීමේදී ,දැනට රජයේ දෙපාර්තමේන්තුවල වැඩ කරන කොන්ත්‍රාත්කරුවන් විසින් ඒ වැඩ බාර නිලධාරිතුමන්ගෙන් තමන් කරන වැඩවල තත්වය පිළිබඳ සහතික පතක් ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ.

යම්කිසි ටෙන්ඩර් පත්‍රයක් හෝ සියලුම ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂෙප කිරීමේත් ටෙන්ඩර් පත්‍රයක යම්කිසි කොටසක් පිළිගැනීමේත් බලය රජය සතු වේ.

ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවසථාවේදී ටෙන්ඩර් ඉදිරිපත් කළ අයට තමන් කැමති නම් පැමිණ සිටිය හැක.

පී. එල්. එම්. බාලදස,
උප ප්‍රාදේශීය වාරිමාර්ග නිලධාරී.

අත්තනගලු ඔය යෝජනා ක්‍රමය,
වාරිමාර්ග කායර්‍යාලය,
ගම්පහ. 16.3.59.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

වයඹ පළාතේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් නිකවැරටිය උප කොට්ඨාශයේ රිදී බැදි ඇල ව්‍යාපාරයේ ප්‍රධාන වැඩවලට ආරක්ෂාව සැපයීම සඳහා මෙම දෙපාර්තමේන්තුවේ රුපියල් 15,000කට හෝ ඊට වැඩියෙන් ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ගෙන් 1959 අප්‍රේල් මස 8 වෙනි බදාදා පෙරවරු 9.30 දක්වා ටෙන්ඩර් භාර ගනු ලැබේ.

නිකවැරටිය උප කොට්ඨාශය භාර ඉංජිනේරු තැන විසින් 1959 අප්‍රේල් 6 වැනි සඳුදා දවල් 12 වනතෙක් ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ. දැනට රජයේ කොන්ත්‍රාත් කරගෙන යනු ලබන කොන්ත්‍රාත් කරුවන් විසින් ඒ ඒ වැඩ භාර ඉංජිනේරු මහතුන්ගෙන් සතුටුදායක අන්දමට වැඩ කරගෙන යනු ලබන බවට සහතික ටෙන්ඩර් පත්‍ර ඉල්ලුම් කරන විට ඉදිරිපත් කළ යුතුයි. ටෙන්ඩර් පත්‍ර ඉල්ලුම් කරන අය රුපියල් 25ක මුදලක් කච්චේරියක හෝ නිකවැරටියේ වාරිමාර්ග කායර්‍යාලයේ තැන්පත් කළ යුතුයි.

මේ පිළිබඳ වැඩි විස්තර නිකවැරටිය උප කොට්ඨාශය භාර වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ලබාගත හැක.

සී. සුබ්‍රමානි,
නිකවැරටිය උප කොට්ඨාශය භාර වාරිමාර්ග
ඉංජිනේරු තැන.

20.3.1959,
වාරිමාර්ග කායර්‍යාලය, නිකවැරටිය.

3. සැලසුම්, විස්තර විභාග, ගිවිසුම් සහ අවශ්‍ය අනෙක් තොරතුරු ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමාගෙන් ලබා ගන්නටත් වැඩය අරඹන ස්ථානය පරීක්ෂා කර බැලීමටත් අයදුම් කරුවනට නිවේදනය කෙරේ.

4. කොන්ත්‍රාත්තුව අත්සන් තැබීමට පෙරාතුව තෝරාගත් අයදුම්කරු විසින් ටෙන්ඩර් කරන ලද මුළු වටිනාකමෙන් 5% වැඩි නොවන මුදලක් කොන්ත්‍රාත්තුව අවංක ලෙස සම්පූර්ණ කිරීමට බැඳීමක් වශයෙන් ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමා නමින් ලංකා බැංකුවේ තැන්පත් කළ යුතු වෙයි.

5. ටෙන්ඩර් පත් කොළඹ ගාලු මුවදෙර පිහිටි මහා ලේකම් ගොඩනැගිල්ලේ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ වැඩ අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමාගේ කාර්යාලයේ අංක 163 දරණ කුටියේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කරන්න. නැතහොත් රෙජිස්ටර් තැපැලෙන් යවන්න. අයදුම්කරුවන් ඔවුන්ගේ ටෙන්ඩර් රෙජිස්ටර් තැපැලෙන් යවන්නට අකමැත්තෙහි නම් මුද්‍රා තබන ලද කවරයේ පිට පැත්තේ වැඩය සහ අයදුම්කරුගේ නමත් ලිපිනයත් සඳහන් කර ඉහත සඳහන් ස්ථානයේදී මේ ටෙන්ඩර් ඉල්ලීම් භාර ගැනුමට බලය දී තිබෙන නිලධාරිතුමාට භාර දිය යුතු වෙයි. මුද්‍රා සහිත ටෙන්ඩර් ඉල්ලීම් භාරගත් බවට ඔහු විසින් කුවිතාන්සියක් නිකුත් කරනවා ඇත.

6. ඉහත සඳහන් පළමුවැනි ඡේදයේ ප්‍රකාර ටෙන්ඩර් භාර ගැනීම නවතාලූ දින පටන් පුරා තෙමසක් තුළ ඉදිරිපත් කරන ලද ටෙන්ඩර් වලංගු ලෙස සලකනු ලැබේ.

7. පළමුවැනි ඡේදයේ සඳහන් ස්ථානයේ දී ඒ නියමිත දින එකී වේලාවට කෙරෙන ටෙන්ඩර් විවෘත කිරීමේ දී හැම ඉල්ලුම්කරුවෙකුට ම පෙනී සිටීමට අවසර ලැබෙනවා ඇත.

ඊ. බී. ඇන්කිටෙල්.
ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු.

ටොරින්ටන් චතුරශ්‍රය,
තැ. පෙ. 1434.
**කොළඹ 7.**
23.3.59.

---

## ග්‍රාම සංවර්ධන සහ ගෘහ කර්මාන්ත දෙපාර්තමේන්තුව

ගිරාගම, දන්තුරේ කර්මාන්ත ශිල්පීන්ගේ අභ්‍යාස මධ්‍යස්ථානයට ළිඳක්, වැසිකිළියක් සහ වැටක් තැනීම සඳහා ටැන්ඩර ග්‍රාම සංවර්ධන සහ ගෘහ කර්මාන්ත අධ්‍යක්ෂක තැන විසින් බාරගනු ලැබේ.

ටැන්ඩර බාරගනු ලබන්නේ 1959 අප්‍රේල් 17 දින පූර්වභාග 10.30 වන තෙක් පමණි. වැඩි විස්තර පහත අත්සන් කරන අයගෙන් විමසුව මැනවි.

ජී. වී. පී. සමරසිංහ,
ග්‍රාම සංවර්ධන සහ ගෘහ කර්මාන්ත අධ්‍යක්ෂ තැන.

1959 මාර්තු 18, කොළඹ 7,
ටොරිංටන් චතුරශ්‍රය.

---

## ලංකා ගමනාගමන මණ්ඩලය

හයිඩ්රෝලික් ට්‍රොලි ජැක්කු සැපයීම සඳහා එවන ටෙන්ඩර පත්‍ර නාරාහේන්පිට කිරුළ පාරෙහි ලංකා ගමනාගමන මාණ්ඩලීය ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති මහතා විසින් 1959යේ මැයි මස 27 වෙනි ද වන බදාදා පෙ. ව. 10 වන තෙක් බාරගනු ලැබේ.

2. ටෙන්ඩර පත්‍ර නියමිත පෝරම කොළවල ලියා අනු පිටපතකින්ද යුක්ත කොට එවිය යුතුයි. මේ පෝරම කොළ බොරලැස්ගමුවේ වේරහැර වූ ලංකා ගමනාගමන මාණ්ඩලීය ප්‍රධාන සම්පාදන කාර්යාලයෙන් 1959 මැයි මස 26 වෙනිදා වන අඟහරුවාදා දවල් 12 වන තෙක් ලබාගත හැකිය. ඒවා දෙන්නේ රු. 100ක ටෙන්ඩර මුදලක් තැන්පත් කළ විටය.

3. ප්‍රධාන සම්පාදක නිලධාරි කාර්යාලයෙන් විස්තර දැනගත හැකිය.

ලංකා ගමනාගමන මණ්ඩලයේ
ලේකම් තැන.

1959යේ මාර්තු මස 17 වෙනි දින,
කොළඹදීය.

## කොළඹ කච්චේරිය

ඇලපිටිවෙල, වැලිසර, රාගම වඩු කර්මාන්ත පාසල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා කොළඹ රජයේ ඒජන්ත තැන විසින් පහත සඳහන් ඇඩ්‍රසයේදී 59.4.15 වන දින සවස 2.30 වන තෙක් සීල් තැබූ ටෙන්ඩර් පත් බාරගනු ලැබේ. 59.4.13 වන දින තෙක් ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ. වැඩි විස්තර සඳහා පහත සඳහන් ලිපියෙන් විමසන්න.

ඇස්. සිවගුරුනාදන්,
කොළඹ ඒජන්තතැන වෙනුවෙන්.

ග්‍රාම සංවර්ධන හා ගෘහ කර්මාන්ත දිස්ත්‍රික් කාර්යාලය,
කච්චේරිය, කොළඹ, තැ. පෙ. 1501,
1959 මාර්තු මස 20 දින දීය.

---

## ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුව

වව්නියාවේ පිරිමි ගොවි පාසැලක් සෑදීම සඳහා 1959යේ මාර්තු 13වෙනි දින අංක 11,699 දරන ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවූ ටැන්ඩර් දැන්වීම මෙයින් අවලංගු කරණු ලැබේ.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
අධ්‍යක්ෂක වෙනුවටය.

ආ. වැ. දෙ., කොළඹ,
59.3.23.

---

කොළඹ කච්චේරි ගොඩනැගිල්ලේ වහලේ උළු මාරු කිරීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1959යේ අප්‍රේල් මස 15වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී බදාදා පෙරවරු 10.30ට ටෙන්ඩර්කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. කොළඹ ටොරිංටන් චතුරශ්‍රයේ ආ. වැ. දෙපාර්තමේන්තුවේ කොළඹ නැගෙනහිර කොටස භාර ගොඩනැගිලි පිළිබඳ විධායක ඉංජිනේරු තැනගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක්ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1959යේ අප්‍රේල් මස 9වෙනි බ්‍රහස්පතින්දා පස්වරු 4.30 වනතෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 6,500ට නොඅඩු ගණනකට ලියාපදිංචිවූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියාපදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රුපියල් 25ක් තැන්පත් කර ලබා ගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
අධ්‍යක්ෂක වෙනුවටය.

කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේදීය, 59.3.23.

---

ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ වැසි වතුර කාණු අළුත්වැඩියා කිරීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1959යේ අප්‍රේල් මස 15වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී බදාදා පෙරවරු 10.30ට ටෙන්ඩර්කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. කොළඹ ටොරිංටන් චතුරශ්‍රයේ ආ. වැ. දෙපාර්තමේන්තුවේ කොළඹ බස්නාහිර කොටස භාර ගොඩනැගිලි පිළිබඳ විධායක ඉංජිනේරු තැනගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක්ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේදී බලාගැනීමට පුළුවන.

3. වර්ෂ 1959යේ අප්‍රේල් මස 9වෙනි බ්‍රහස්පතින්දා පස්වරු 4.30 වනතෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 5,000ට නොඅඩු ගණනකට ලියාපදිංචිවූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා

මහනුවර උඩරට ගොවි ජන සභාවේ විධායක ඉංජිනේරු තැනගේ නිවාසය සහ කාර්යාලය සෑදීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ 1, ට්‍රාන්ස්වර්ක්ස් හවුස්හී පිහිටි ප්‍රවාහණ සහ රජයේ වැඩ පිළිබඳ අමාත්‍යාංශයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වෂී 1959 අප්‍රියෙල් මස 22 වෙනි බදාදා පෙරවරු 9.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීමට නියමිත වේලාව වන මෙදින පස්වරු 2.30ට ටෙන්ඩර් කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. මහනුවර ආ. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු (නිර්මාණ) තැනගෙන් පෝර්ම කොළ ලබා ගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධව සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබා ගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වෂී 1959යේ අප්‍රේල් මස 9 වෙනි බ්‍රහස්පතින්දා පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 60,000ට නො අඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක්, ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 100ක් තැන්පත් කර ලබා ගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. ටෙන්ඩර් සඳහා තැන්පත් කළ යුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කායඝිලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක
වෙනුවට.

කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ,
කාර්යාලයේදීය. 59.3.23.

---

මඩකලපු දිස්ත්‍රික්කයේ වෙලායිවෙනෝ ආහාර ගබඩාවක් සෑදීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ 1, ට්‍රාන්ස්වර්ක්ස් හවුස්හී පිහිටි ප්‍රවාහණ සහ රජයේ වැඩ පිළිබඳ අමාත්‍යාංශයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වෂී 1959 අප්‍රේල් මස 22 වෙනි බදාදා පෙරවරු 9.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීමට නියමිත වේලාව වන මෙදින පස්වරු 2.30ට ටෙන්ඩර් කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. මඩකලපුවේ ආ. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් පෝර්ම කොළ ලබා ගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිට පතක් ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධව සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබා ගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වෂී 1959යේ අප්‍රේල් මස 9 වෙනි බ්‍රහස්පතින්දා පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 1,80,000ට නො අඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක්, ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 200 ක් තැන්පත් කර ලබා ගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. ටෙන්ඩර් සඳහා තැන්පත් කළ යුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කායඝිලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක
වෙනුවට.

කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ,
කාර්යාලයේදීය. 59.3.23.

කෑගල්ලේ පොලිසියට අළුත් ගොඩනැගිලි සෑදීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ 1, ට්‍රාන්ස්වර්ක්ස් හවුස්හී පිහිටි ප්‍රවාහණ සහ රජයේ වැඩ පිළිබඳ අමාත්‍යාංශයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වෂී 1959යේ අප්‍රේල් මස 22 වෙනි බදාදා පෙරවරු 9.30 වන තෙක් භාරගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීමට නියමිත වේලාව වන මෙදින පස්වරු 2.30ට ටෙන්ඩර් කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. කෑගල්ල ආ. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැන ගෙන් පෝර්ම කොළ ලබා ගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධව සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබා ගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වෂී 1959යේ අප්‍රේල් මස 9 වෙනි බ්‍රහස්පතින්දා පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 1.50,000ට නො අඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක්, ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 200 ක් තැන්පත් කර ලබා ගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. ටෙන්ඩර් සඳහා තැන්පත් කළ යුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කායඝිලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක
වෙනුවට.

කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ,
කාර්යාලයේදීය. 59.3.23.

---

# බඩු බාහිරාදිය විකිණීම

## දැන්වීමයි

මෙහි පහත දක්වෙන ද්‍රව්‍යයන් අප්‍රේල් මස 1 වැනි දින පස්වරු 2ට පිජන්ච් වීදියේ අංක 115 දරණ තිරුපුඩි නිවාසයන් හිදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. එදින පස්වරු 12.30 සිට ඒ ද්‍රව්‍යයන් පරීක්ෂා කිරීම සඳහා එම ස්ථානයේ තබනවා ඇත. මුදල් ගෙවීම වෙන්දේසි කළ ස්ථානයේදීම කළ යුතුය.

| | | |
|---|---|---|
| මස් සේප්පු | ... | 2යි |
| අත් බාල්දි | ... | 30යි |
| ලී ස්ටූල්ස් | ... | 5යි |
| ආරෝග්‍යශාලා ස්ටෑන්ඩ්ස් | ... | 25යි |
| බට පැළලි | ... | 10යි |
| මේස පෑන් | ... | 5යි |
| නාන ටබ්ස් | ... | 22යි |
| කිරි ජෝගු | ... | 5යි |
| බොයිලේරු | ... | 31යි |
| ටයර් | ... | 2යි |
| ටියුබ් | ... | 2යි |
| පාන් කූඩ | ... | 6යි |
| අල්මාරි | ... | 3යි |
| තොටිලි | ... | 13යි |
| අත් පුටු | ... | 15යි |
| සාමාන්‍ය පුටු | ... | 10යි |
| කුණු කූඩ | ... | 67යි |

ආර්. වේලුපිල්ලේයි,
අතිරේක සෙක්‍රතාරිස්,
කොළඹ මණ්ඩලීය ආරෝග්‍යශාලා
පරිපාලක තැන වෙනුවට.

කින්සි පාර,
කොළඹ, 20.3.59.

---

# විශෙෂ නිවේදනයයි

1959 අප්‍රියෙල් 10 වැනි සිකුරාද ආණ්ඩුවෙ නිවාඩු දිනයක් වන බැවින්, 1959 අප්‍රියෙල් මාසයේ දෙවැනි සුමානයේ ගැසට් පත්‍රය, 1959 අප්‍රියෙල් 9 වැනි බ්‍රහස්පතින්ද නිකුත් කරන බැවින්, එහි පළකිරීම සඳහා එවන සියළුම දැන්වීම් සහ නිවේදන, 1959 අප්‍රියෙල් 6 වැනි සඳුද පස්වරු 4ට ප්‍රථම ආණ්ඩුවේ මුද්‍රණාලයට ලැබෙන්ට සැලැස්විය යුතු බව කාගේත් දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

1959 මාර්තු 23 වැනි දින,
කොළඹ, ආණ්ඩුවේ මුද්‍රණාලයේ දීය.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.